# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2016

Consumer Affairs Authority Annual Report 2016

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
பாவனையாளர்அலுவல்கள்அதிகாரசபை
**CONSUMER AFFAIRS AUTHORITY**

# සභාපතිතුමාගේ පණිවිඩය



පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන කාර්ය සාධනය ආශ්‍රිත 2016 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශය සතුටු වෙමි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දහතුන් වසරක කාර්යසාධනය විශ්ලේෂණය කිරීමේදී මාගේ අදහස අනුව අප ආයතනයට දැනුවත් ව්‍යාපාරික ප්‍රජාවක් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරන අතර තරඟකාරී ව්‍යාපාරික සමාජයක් තුළ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම යන මුඛ්‍ය ඉලක්කය සැළකියයුතු ප්‍රමාණයකට සාක්ෂාත් කරගැනීමට හැකිවී තිබේ. දෛනිකව අප වෙත ලැබුණු අප්‍රමාණ පැමිණිලි සංඛ්‍යාව සහ මාධ්‍ය මඟින් ප්‍රචාරය වූ විවේචන මෙම තත්ත්වය වඩාත් ශක්තිමත් කිරීමට හේතු විය.

වර්තමාන තාක්ෂණික විප්ලවීය යුගය තුළ ඕනෑම උගත් පාරිභෝගිකයෙකුට වෙළඳ ප්‍රයෝග, අසාධාරණ ලෙස වෙළඳාම වර්ධනයවීම, කොන්දේසිගත ව්‍යාපාර, අලෙවිය අඩුකිරීම සහ අසාධාරණ වෙළඳ කොන්දේසි ආදී පාරිභෝගික ශුභසිද්ධිය කෙරෙහි අහිතකර අන්දමින් බලපාන අක්‍රමවත් වෙළඳ ප්‍රතිපත්තිවලට මුහුණදීමට සිදුවියහැකිය. අපගේ සන්දර්භය තුළ නව මෙන්ම සුවිශේෂී විධාන නිකුත් කරමින් මෙම අර්බුදකාරී පරිසරය තුළ පාරිභෝගිකයන් අරක්ෂා කිරීම සඳහා අප විසින් මහත් පරිශ්‍රමයක් දරා තිබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ සම්බන්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ දැනුවත් කිරීම සඳහා පාරිභෝගික හිතකර ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබේ. මීට අමතරව ව්‍යාපාරික ප්‍රජාව සහ පාරිභෝගික ප්‍රජාව යන දෙපාර්ශවය ම දැනුවත් කිරීමේ අරමුණ පෙරදැරිව අධිකාරිය විසින් වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර එමඟින් ශ්‍රී ලාංකික ව්‍යාපාරික පරිසරය තුළ දැනුම් තේරුම් සහිත ව්‍යාපාරිකයන් මෙන්ම පාරිභෝගිකයින් බිහිවීම සහතික කර තිබේ.


ආසාධාරණ වෙළඳ ක්‍රියාමාර්ගයන්ගෙන් සාමාන්‍ය ජනතාව සහ ව්‍යාපාරිකයන් මුදවා ගැනීම සඳහා 2016 වර්ෂයේ දී මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 355 ක් සහ ව්‍යාපාරික දැනුවත්කිරීම් 327 ක් පවත්වන ලදී. තවද, පාරිභෝගික අයිතීන් සම්බන්ධයෙන් බාල පරපුර ආරක්ෂා කරගැනීම සඳහා පාසැල් දැනුවත් කිරීම් වැඩසටහන් 206 ක් පවත්වන ලදී. මේ අතරතුර, සාර්ථක වැටලීම් 21,873 ක් සිදුකර රුපියල් මිලියන 91 කට අධික දඩ පනවන ලදී. 2015 වර්ෂය සමඟ සසඳන විට දඩ පැනවීම 36% කින් වර්ධනය වී තිබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතෙහි 13 සහ 32 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වෙයි. 2016 වර්ෂයේ දී පැමිණිලි 1981 ලද අතර විමර්ශන සිදුකර නියෝග නිකුත් කරන ලදී. අධිකරණ නියෝගයන්ට අනුගත නොවූ පාර්ශව වෙත ඒවා ක්‍රියාත්මක කිරීමට බලකර සිටීමට පියවර ගන්නා ලදී.

මෙම සාර්ථකත්වය අත්කරගැනීම සඳහා උපකාර වූ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සේවක මණ්ඩලයට මාගේ කෘතඥතාව පළකිරීමට මෙම අවස්ථාව උපයෝගී කරගනිමි.

තවද කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සහ ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමා ගේ අගනා උපදෙස් , අභිප්‍රේරණය සහ මඟපෙන්වීම සම්බන්ධයෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පළකරන අතර නිවැරදි තීරණ ගනිමින් රාජකාරිය නිරවද්‍යාව ඉටුකිරීමට ඒවා හේතුපාදක විය.

අවසන් වශයෙන් අපගේ සේවය සඳහා අගයකිරීම් යොමුකළ සියලුම පාරිභෝගිකයන්ට සහ පැමිණිලිකරුවන්ට අපගේ ප්‍රණාමය පුද කර සිටිමි.



හසිත තිලකරත්න

**සභාපති**

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**දැක්ම**

සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක් තුළ මනාව සුරක්ෂිත වූ පාරිභෝගිකයෙකු බිහි කිරීම.

**මෙහෙවර**

පාරිභෝගික සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරීත්ව ප්‍රවර්ධනය තුළින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම .

**ඒකාබද්ධ ඉලක්ක**

1) වෙළෙඳාම විධිමත් කිරීම තුළින් වඩාත් තෘප්තිමත් වූ පාරිභෝගිකයින් බිහි කිරීම.
2) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලදී පාරිභෝගිකයාට සහන සැලසීම.
3) අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් පාරිභෝගිකයින් සවිබල ගැන්වීම.
4) තරඟවිරෝධී චර්යාවන්ට එරෙහිව වෙළෙන්දන් හා සැදන්නන් ආරක්ෂා කරමින් යහපත් තරඟකාරිත්ව ප්‍රවර්ධනය කිරීම.
5) අධිකාරියෙහි කටයුතු පුළුල් කිරීම තුළින් ආයතනික සංවර්ධනය ළඟා කර ගැනීම.

**ආයතනික සාරධර්ම**

- විශ්වාසනීයත්වය
  කාර්යසාධන අනුකූලතාව පවත්වා ගැනීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම.
- අවංක භාවය සහ ඍජුභාවය
  සියලුම කාර්යයන්හි දී අවංක වීම, සාධාරණ වීම සහ යුක්තිගරුක වීම.
- වගකීමට බැඳී සිටීම
  විනිවිදභාවය ආරක්ෂා කිරීම, වගකිවයුතු බව සහ ඉටුකරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම
- කණ්ඩායම් හැඟීමට ගරුකිරීම
  අන්‍යොන්‍ය අවබෝධය, එකිනෙකාට ගෞරව කිරීම සහ එකිනෙකා අතර විශ්වාසය ගොඩනැංවීම සහ මනා සන්නිවේදනය සහ නම්‍යශීලීභාවය වර්ධනය කරමින් පොදු ඉලක්කයන් කරා ළඟාකරගැනීම උදෙසා සියලුම සේවකයින් එක්ව කටයුතු කිරීම.
- ප්‍රසාදය පළ කිරීම
  සේවකයින්ගේ විශිෂ්ට කාර්යඵල අගය කිරීම සහ ප්‍රශංසා කිරීම
- අරමුණු ළඟා කරගැනීම සඳහා කැපවීම
  පවරා ඇති කාර්යයන් කැපවීමෙන් යුක්තව ඉටුකිරීම
- විශ්වසනීය ප්‍රතිචාර දැක්වීම
  සේවා සැලසීම සඳහා කැමැත්තක් දැක්වීම සහ සූදානම්වීම
- නිර්මාණශීලිත්වය සහ නව ක්‍රමෝපායන් භාවිතයට ගැනීම
  සියලුම ක්ෂේත්‍රයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ නව අදහස් උත්පාදනය කිරීම

1 වන සහ 2 වන මහළ
සතොස මහලේකම් ගොඩනැගිල්ල
අංක. 27, වොක්ෂෝල් වීදිය
කොළඹ 02
03-05-2018

කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍යතුමා,

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2016 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් වාර්තාව සහ විගණකාධිපති වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

හසිත තිලකරත්න
**සභාපති**

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වාර්ෂික වාර්තාව -2016

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | අප ගැන | |
| | 1.1 හැඳින්වීම - - - - - - - | 5 |
| | 1.2 අධිකාරිය පිහිටුවීම - - - - - - - | 5 |
| | 1.3 අධිකාරියේ කාර්යමණ්ඩලය - - - - - - | 5 |
| | 1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව - - - - - | 6 |
| 2. | අධිකාරියේ අරමුණු - - - - - | 7 |
| 3. | අධිකාරියේ කාර්යභාරය - - - - - - | 7 |
| 4. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය සාධනය / පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව -2016 - - - - - - | 8-23 |
| 5. | 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - - - - | 24 |
| 6. | 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන - - | 25 |
| 7. | 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය - - - | 26-35 |
| 8. | 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව - - - | 36-43 |
| 9. | විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් - - | 44-48 |

## 1.1 හැඳින්වීම

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත අවලංගු කරමින් සම්මත කරන ලද 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලදී.

පනතේ පූර්විකාව අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සමස්ත අරමුණ වනුයේ වෙළඳාම සහ භාණ්ඩ හා සේවා මිල ගණන් විධිමත් කිරීම තුළින් පාරිභෝගිකයා වඩාත් හොඳින් ආරක්ෂා කිරීම, අසාධාරණ සහ සීමිත වත් පිළිවෙත්වලට එරෙහිව වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමයි. තවද හැකි සෑම අවස්ථාවකදීම තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම, භාණ්ඩ හා සේවා වෙළෙඳුන් සහ නිෂ්පාදකයන් අතර යහපත් තරඟයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ.

## 1.2 අධිකාරිය පිහිටුවීම

පනෙතහි විධිවිධාන අනුව අධිකාරිය සභාපතිවරයෙකුගෙන් සහ පනතෙහි විශේෂයෙන් දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයින් අතරින් අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන දහයකයට නොඅඩු සංඛ්‍යාවක් වන සාමාජිකයින්ගෙන් ද සමන්විත වේ.

**අධිකාරියේ සාමාජිකයින්**

2016 වර්ෂය අවසානය වන විට තනතුරු දරන ලද සාමාජිකයින් ගේ නම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | හසිත තිලකරත්න මහතා | සභාපති |
| 2. | ඒ.එච්.එම්.අන්වර් මහතා | පූර්ණ කාලීන සාමාජික - 2016.07.01 වන දින සේවයෙන් අස්විය |
| 3. | එම්.එස්.එම් ෆවුසර් මහතා | පූර්ණ කාලීන සාමාජික –2016.10.17 වන දින සේවයෙන් අස්විය |
| 4. | ආදාර්ය එම්. එම්. හිල්මි | පූර්ණ කාලීන සාමාජික |
| 5. | එම්.ඉසෙඩ්.රසීන් මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 6. | ඒ.ආර්.බී. නිහ්මත්දීන් මහතා | පූර්ණ කාලීන සාමාජික |
| 7. | ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මෙය | භාණ්ඩාගාර නියෝජිත |
| 8. | වී.එම්. වීරසිංහ මහතා | අමාත්‍යාංශ නියෝජිත –2016.10.18 වන දින විශ්‍රාම ලැබීය |
| 9. | එස්.ටී. අබේගුණවර්ධන මහතා | සාමාජික |
| 10. | එම්.ටී.ඒ. සයින් මහතා | සාමාජික |
| 11. | රූබන් වික්‍රමාරච්චි මහතා | සාමාජික |
| 12. | එච්.බී.දයාරත්න මහතා | සාමාජික |
| 13. | වරුණ සුරේන් අලව්ව මහතා | සාමාජික |
| 14. | ආචාර්ය ඒ.එම්.එම්.රියාස් | සාමාජික |
| 15. | සින්නතම්බි නාගයියා මහතා | සාමාජික |

## 1.3 අධිකාරියේ කාර්ය මණ්ඩලය

හසිත තිලකරත්න මහතා 2016 වර්ෂයේ දී අධිකාරියේ සභාපති ධූරය දැරීය. 2015.11.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා (ශ්‍රී. ලං. ප.සේ) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බවට පත්විය.

අධිකාරියේ අංශ ප්‍රධානීන්

01 දීප්ති තිසේරා මිය
M.PA [PIM-Sri J] – නීතිඥ
අධ්‍යක්ෂිකා - අනුකූලවීම් සහ බලගැන්වීම්

02 ශාන්තිනී තිරුනීලකන්දන් මිය
[ACEA]
අධ්‍යක්ෂිකා - තරඟකාරීත්ව ප්‍රවර්ධන

03 ඩබ්.එම් . ප්‍රියන්ත මහතා
MPM, B.Com (Sp) Hons, AIPFM, DPFM
අධ්‍යක්ෂ - මූල්‍ය

04 රසිකා සාවිත්‍රි විජේසේකර මිය
B.Sc Accounting (Sp) Hon USJ,
CBA,MAAT
අභ්‍යන්තර විගණක

05. චන්ද්‍රිකා තිලකරත්න මිය
අධ්‍යක්ෂිකා
පාරිභෝගික කටයුතු සහ තොරතුරු

06. සම්පත් අඟුලුගහ මහතා
B. Com (Sp) Hons, AIPM(SL). Dip in PM
අධ්‍යක්ෂ-මානව සම්පත් සහ පරිපාලන

07. නෙරංජලා ජෙගනාදන් මෙය
ACA, MBA (J'pura)
අධ්‍යක්ෂිකා - මිලකිරීම් සහ කළමනාකරණ

1.4 පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

මෙම සභාව පිහිටුවන ලද්දේ වාණිජ නීතිය, ව්‍යාපාරික , ව්‍යවසාය කළමනාකරණය, වෙළඳ ප්‍රතිපත්ති සහ පාරිභෝගික කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහිත විශේෂඥවරුන් තිදෙනෙකුගෙන් සමන්විතවය. මෙම සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් යොමුකරනු ලබන සියලු ඉල්ලීම් කෙරෙහි යොමු වී තීරණ ගතයුතුය. තවද, පනතෙහි 38 වන වගන්තිය යටතේ තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධ පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සහ තීරණ ගැනීම, 19 වන වගන්තිය යටත් උපරිම සිල්ලර මිල නියම කිරීම, සහ 19 වන සහ 20 වන වගන්ති යටතේ අනිසි මිළගණන් සම්බන්ධයෙන් චෝදනා කිරීම පිළිබඳ වගකීමට සභාව බැඳී සිටියි.

<u>පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ සාමාජිකයින්</u>

| | | |
|---|---|---|
| එන්. එම්. ෂහීඩ් මහතා | - | සභාපති |
| ඩී.ඩබ්. ජොන්තාසන් මහතා | - | සාමාජික |
| එම්.ඩී.එම්.රිස්වි මහතා | - | සාමාජික |

ලේඛා ආර්යරත්න මිය (නීතිඥ) - සභා ලේකම්

## 2. අධිකාරියේ අරමුණු

අ. පාරිභෝගිකයින්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.

ආ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

ඇ. හැකි සෑමවිටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිලකට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම.

ඈ. අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහන ලබාදීම.

## 3. අධිකාරියේ කාර්යභාරය

1) අධිකාරිය විසින් පහත දෑ පාලනය කිරීම හෝ ඉවත් කිරීම සිදු කරනුලැබේ –
   - අ.ව්‍යවසාය අතර සීමාකාරී වෙළෙඳ ගිවිසුම්
   - ආ. ව්‍යවසායයන් අතර මිළ පිළිබඳ වැඩපිළිවෙළවල්
   - ඇ. ව්‍යවසායයන්අතර මිළ පිළිබඳ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මකකිරීම
   - ඈ. වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළඳපොළේ සැලකියයුතු කොටසක දේශීය වෙළදාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබද වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදාගැනීම; හෝ දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරීත්වය
2) තරඟ විරෝධී හා ආධිපත්‍ය තත්ත්වයන් අනිසි ලෙස යොදාගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ සිදුකිරීම.
3) භාණ්ඩ හෝ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වාගෙන ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.
4) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගත හැකිවීම සහ ඒවායේ තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, මිලදීගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිතා කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම
5) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම.
6) මෙම පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.
7) වෙළෙඳපොල තරඟකාරීත්වය අඩු ඵලදායීතාවෙන් පවතින අවස්ථාවලදී වෙළෙඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම
8) වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතුවලට අදාලව අධ්‍යයන භාරගැනීම, වාර්තා පළකිරීම, සහ මහජනතාවට තොරතුරු සැපයීම.
9) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාරගැනීම.

10) පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම.

11) වෙළෙඳපොල තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම.

12) පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම

13) අධිකාරිය විසින් ලබාදෙනුලබන යම් සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම.

14) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය වියහැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත්කිරීම; සහ

15) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍යය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කටයුතු කිරීම.

**4. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යසාධනය**

ආයතනික ව්‍යුහය අනුව අධිකාරිය අධ්‍යක්ෂවරුන් 6 දෙනෙක් යටතේ පාලනය වන අංශ 6 කින් සහ අභ්‍යන්තර විගණන අංශයෙන් සමන්විත වේ.

එනම්;

1) පාරිභෝගික කටයුතු සහ තොරතුරු
2) අනුකූලවීම් හා බලගැන්වීම්
3) මිලකිරීම් සහ කළමනාකරණ
4) තරඟකාරීත්ව ප්‍රවර්ධනය
5) මුදල්
6) මානව සම්පත් සහ පරිපාලන
7) අභ්‍යන්තර විගණන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2016 වර්ෂය සඳහා වන කාර්ය සාධනය පහත දැක්වේ.

**1. හානිකර මෙන්ම ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවාවන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කරගැනීම**

**අ.** පනතෙහි 10 වන සහ 12 වන වගන්ති යටතේ නිකුත් කරන ලද විධාන

- **විධාන අංක 60 -** භාණ්ඩ සඳහා නිකුත් කරනු ලබන ප්‍රතිඥාහාර (වගකීම්) සහතික / ලියවිලි වල අඩංගු සියලු කොන්දේසි සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් මුද්‍රණය කළයුතු බවට සියලු නිෂ්පාදකයින්, ආනයනකරුවන් හා වෙළඳුන් වෙත විධානය කිරීම.

- **විධාන අංක 61-** ගොඩනැඟිලි කර්මාන්තය සඳහා යොදා ගන්නා සියලුම තීන්ත , වාර්නිෂ්, හා ද්‍රාවක බෝතල් , ඇසුරුම් සහ බහාලුම්වල පහත සඳහන් තොරතුරු පැහැදිලිව මුද්‍රණය කළයුතු බවට විධානය කිරීම. කාණ්ඩ අංකය, නිෂ්පාදිත දිනය, භාවිතයට ඉතා සුදුසු අවසන් දිනය, පරිමාව, උපරිම සිල්ලර මිල, තීන්ත වල අඩංගු සම්පූර්ණ ඊයම් ප්‍රමාණය .

- **විධාන අංක 62 -** බෝතල් කළ, ඇසුරුම්ගත කළ, හෝ බහාලුම්ගත කළ ආහාරයට ගන්නා සියලු තෙල් වර්ග, සිල්ලර හෝ තොග වශයෙන් විකුණනු ලබන සියලු නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන්, හා වෙළඳුන් වෙත එකී ආහාරයට ගන්නා තෙල් වර්ගයන්හි බෝතල්, ඇසුරුම් හෝ බහාලුම්වල පහත සඳහන් තොරතුරු මුද්‍රණය කළ යුතු බවට විධාන කිරීම. කාණ්ඩ අංකය, නිෂ්පාදිත දිනය, කල් ඉකුත්වන දිනය, පරිමාව / බර, උපරිම සිල්ලර මිල, නිෂ්පාදකයාගේ නම හා ලිපිනය, එය ආනයනය කරන ලද්දක් නම් නම, ලිපිනය සහ ආනයනිත රට, එය තොග වශයෙන් ආනයනය කර නැවත අසුරා ඇත්නම් නිෂ්පාදිත දිනය සහ නැවත ඇසුරුම් කළ දිනය, එය මිශ්‍රිත තෙල් වර්ගයක් නම් මිශ්‍රණයේ අඩංගු තෙල් වර්ගවල හා ඒවායේ අඩංගු ප්‍රතිශතයන් පිළිබඳ විස්තරයක් සමඟ එය මිශ්‍රිත / කළවම් කළ තෙල් බවට වන ප්‍රකාශයක්

**ආ.** පනතෙහි 20(5) වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග

- **නියෝග අංක39 -** භාණ්ඩ දාහතරක් සඳහා උපරිම සිල්ලර මිල නියම කර තිබේ. (මයිසූර් පරිප්පු, වියළි හාල්මැස්සන්, කඩල, මුංඇට, ටින් කළ මාළු, සුදු සීනි, තිරිඟු පිටි, සම්පූර්ණ යොදය සහිත කිරිපිටි, කුකුල් මස්, අල, බී ළූනු, වියළි මිරිස්, සස්ටජන්, උම්මලකඩ)

**ඇ.** ගුණාත්මකභාවයෙන් අඩු ආනයනික භාණ්ඩ විමර්ශනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ දිවයිනට ඇතුළුවීම වැලැක්වීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ. එබඳු සිද්ධීන් 140 ක් විමර්ශනය කරන ලද අතර ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ අනුකූල නොවීම හේතුවෙන් ප්‍රති- අපනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නිර්දේශ කරන ලදී.

**ඈ .** ජාතික කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති / නීති හඳුන්වාදීමට

ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරීය සෞඛ්‍ය අමාත්‍යාංශය , තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය , පරිසර අමාත්‍යාංශය , බලශක්ති අමාත්‍යාංශය ,ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික කවුන්සිලය යටතේ ක්‍රියාත්මක වන ජාතික මට්ටමේ කමිටු නියෝජනය කරමින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති හඳුන්වා සහාය දක්වයි.

## 2. වංචාකාරී කටයුතු සහ අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම

**අ.** ව්‍යාපාරික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ සිවිල් සමාජ සහභාගීත්ව වැඩසටහන් මඟින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂාකිරීම, සංවර්ධනය කිරීම සහ බලය ලබාදීම සිදු කරනු ලැබේ. ව්‍යාපාරිකයින් දැනුවත්කිරීමේ වැඩසටහන් සැලසුම්කිරීම තුළින් මෙය ක්‍රියාත්මක කරන ලදී.

2016 වර්ෂයේදී අධිකාරිය විසින් ව්‍යාපාරික ප්‍රජාව සඳහා වැඩසටහන් 327 ක් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක **1** - 2016 දී පවත්වන ලද ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්

| **පළාත** | **දිස්ත්‍රික්කය** | **ව්‍යාපාරික දැනුවත් කිරීමේ වැඩසටහන්** |
|---|---|---|
| | | **වැඩසටහන් සංඛ්‍යාව** |
| මධ්‍යම පළාත | මහනුවර | 12 |
| | මාතලේ | 19 |
| | නුවරඑළිය | 12 |
| නැගෙනහිර පළාත | අම්පාර | 10 |
| | මඩකලපුව | 12 |
| | ත්‍රිකුණාමලය | 17 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 06 |
| | පොළොන්නරුව | 11 |
| උතුරු පළාත | යාපනය | 12 |
| | කිලිනොච්චි | 21 |
| | මන්නාරම | 20 |
| | මුලතිවු | 26 |
| | වව්නියාව | 26 |
| වයඹ පළාත | කුරුණෑගල | 01 |
| | පුත්තලම | 09 |
| සබරගමු පළාත | කෑගල්ල | 05 |
| | රත්නපුර | 11 |
| දකුණු පළාත | ගාල්ල | 11 |
| | හම්බන්තොට | 14 |
| | මාතර | 12 |
| ඌව පළාත | බදුල්ල | 08 |
| | මොණරාගල | 13 |
| බස්නාහිර පළාත | කොළඹ | 20 |
| | ගම්පහ | 10 |
| | කළුතර | 09 |
| **එකතුව** | | **327** |

ආ. වෙළෙඳපොළෙහි සිදුකරනලද වැටලීම් සහ විමර්ශන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතෙහි විධිවිධාන අනුව ලේබලයෙහි උපදෙස් ප්‍රදර්ශනය කිරීම උල්ලංඝණය කිරීම , වෙළෙඳපොළ අගයට වඩා වැඩි මිලට අලෙවි කිරීම, භාණ්ඩ අලෙවි කිරීම ප්‍රතික්ෂේප කිරීම , භාණ්ඩ සන්තකයෙහි තබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම, භාණ්ඩ සඟවා තබාගැනීම , අධිකාරියෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල ඉහළ දැමීම , මිල දර්ශන ප්‍රදර්ශශය නොකිරීම , මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් නොකිරීම, නොමඟයැවීම හෝ වංචාකාරී කටයුතු සිදුකිරීම හෝ නිෂ්පාදකයින් / වෙළෙඳුන් විසින් සිදුකරන ලද ව්‍යාජ නියෝජන වැටලීමට ලක් කිරීම සහ විමර්ශනය කිරීම. වංචාකාරී වෙළෙඳුන්ට අදාලව පනතෙහි 60 වන වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු පැවරීම සහ දඩ මුදල් නියම කිරීම සිදු කරනු ලැබේ.

වගු අංක **-2 -** වෙළඳපොල වැටලීම් සහ දඩ මුදල් නියම කිරීම්වල ප්‍රගතිය

| සිදුකරන ලද ක්‍රියාකාරකම් (ඉලක්ක) | වැටලීම් සංඛ්‍යාව | සිදුවීම් සංඛ්‍යාව | නියම කරන ලද දඩ (රුපියල්) |
|---|---|---|---|
| **වෙළෙඳපොළ වැටලීම් සහ විමර්ශන** | | | |
| - 10 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (10 වන වගන්තියෙහි දක්වන ලද උපදෙස් උල්ලංඝනය කිරීම) | 5,451 | 5,305 | 24,076,000 |
| - 11 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩයේ සඳහන් මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම) | 1,308 | 1,087 | 3,921,500 |
| - 12වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ප්‍රමිතීන්ට අනුකූල නොවීම) | 204 | 82 | 504,000 |
| - 15 වන වගන්තිය සම්බන්ධ වෙළෙඳපොළ විමර්ශන | 5 | 7 | 33,000 |
| - 16 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ඕනෑම භාණ්ඩයක් සන්තකයේ තබාගැනීම ප්‍රතික්ෂේප කිරීම) | 19 | 16 | 235,500 |
| - 17 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (භාණ්ඩ සඟවා තබාගැනීම) | 3 | 1 | 9,000 |
| - 18 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ප්‍රකාශිත ද්‍රව්‍ය මත පදනම් කරගත් ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම) | 38 | 49 | 313,500 |
| - 20 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන | 1,492 | 1,673 | 7,267,000 |
| - 26වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (මිල දර්ශනය ප්‍රදර්ශනය නොකිරීම) | 5,546 | 5,802 | 17,107,600 |
| - 28 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (වෙළෙන්දන් විසින් මිලදී ගන්නන් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම.) | 5 | 6 | 29,000 |
| - 30 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟ යැවීම සහ වංචාකාරී කටයුතු) | 2,978 | 2,747 | 13,531,700 |
| - 30 සහ 31 වන වගන්ති යටතේ වෙළෙඳපොළ විමර්ශන (නොමඟයැවීම සහ ව්‍යාජ නියෝජන) | 2,885 | 3,110 | 1,4310,000 |
| - 31 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ විමර්ශන (ව්‍යාජ නියෝජන) | 1,939 | 2,011 | 9,514,300 |
| මුළු වැටලීම් සහ දඩ නියම කිරීම් | **21,873** | **21,896** | **90,852,100** |

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද විශේෂ වැටලීම්</u>**



**වංචාකාරී ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය (SLS certification) ලේබලයෙහි සටහන් කරන ලද පානීය ජල බෝතල් සම්බන්ධයෙන් වැටලීමක් සිදුකිරීම**




**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරීන් විසින් කොළඹදී කල් ඉකුත් වූ කෝපි සහ සෝස් විශාල තොගයක් වැටලීම**




**පරිභෝජනය සඳහා නුසුදුසු සහල් නැවත ඇසුරුම් කිරීමේදී වැටලීම**

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදුකරන ලද වැටලීම්</u>**




**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවන ලද දඩ මුදල්</u>**




**3. අසාධාරණ වෙළඳ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වූ පාරිභෝගිකයින්ට සහන සැලසීම**

අ. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

පාරිභෝගික අධිකාරි පනතෙහි 13 වන සහ 32 වන වගන්ති යටතේ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වේ. නිෂ්පාදකයා හෝ වෙළෙන්දා විසින් ලබාදෙන ලද බලපත්‍රයට හෝ ඇපසහතිකය සම්බන්ධ කරුණු හෝ වෙනත් දෑ සමඟ අනුකූල නොවන පරිදි භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරියට විමර්ශන කළහැකිය.

වගු අංක 3 සහ 4 මගින් පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ 2016 වර්ෂයේදී අත්කර ගන්නා ලද ප්‍රගතිය වගු අංක 3 සහ 4න් දැක්වේ.

| | එකතුව |
|---|---|
| ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 1981 |
| තැපෑලෙන් | 1651 |
| දුරකථන ඇමතුම් මගින් | 330 |
| වැටලීම් (ප්‍රධාන කාර්යාලය/දිස්ත්‍රික් කාර්යාල) | 332 |
| වෙනත් ආයතන වෙත පවරන ලද | 103 |
| වැඩි දුර විමර්ශන සහ නෛතික ක්‍රියාමාර්ග | 201 |
| දිස්ත්‍රික් ඒකක වෙත යොමු කිරීම (පුද්ගල සහන සඳහා ) | 36 |
| කටයුතු අවසන් කරන ලද පැමිණිලි | 972 |
| ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි | 13 |
| පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව | 706 |

(පූර්ව වර්ෂයේ පැමිණිලිද ඇතුලත්ව )

වගු අංක – 4 - පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන :

| **පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන** | |
|---|---|
| විමර්ශන සංඛ්‍යාව | 350 |
| පූර්ව මාසයේ / වර්ෂයේ සිට සිදු කෙරෙන විමර්ශන | 221 |
| නව විමර්ශන | 129 |
| විසඳුම් ලබා දෙන ලද විමර්ශන | 66 |
| නිකුත් කරන ලද විධාන | 68 |

(පූර්ව වර්ෂයේ පැමිණිලිද ඇතුළත්ව )

වැටලීම්වලට අමතරව අධිකාරිය විසින් අධිකරණයෙහි නඩු 59 ක් පවරා ඇති අතර අධිකාරිය විසින් දඩ මුදල් නියම කිරීම මගින් රුපියල්.500,000/- රැස් කරනලදී

<u>අධිකරණ නඩු</u>

| වර්ගය | **2016** |
|---|---|
| නීති හා බලගැන්වීම් අංශය විසින් ගොනු කරන ලද නඩු | 59 |
| අධිකරණයෙහි පෙනී සිටීම | 728 |
| දඩ මුදල් (අධිකරණ නඩු මගින් ලද) | රු. 500,000/- |
| විභාග කරන ලද නඩු | 196 |

**අ. පාරිභෝගික අධ්‍යාපනය සහ බලගැන්වීම**

පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය , සම්මන්ත්‍රණ සහ වැඩමුළු ,ප්‍රදර්ශන ආදිය මගින් පාරිභෝගික අයිතීන් සහ වගකීම්, වර්තමාන පාරිභෝගික නීතිය යහපත් පාරිභෝගික චර්‍යාවන්, සහ යහපත් ව්‍යාපාරික පිළිවෙත් ආදිය පිළිබඳව දැනුවත් කරනු ලැබේ. මීට අමතරව පාරිභෝගික අයිතිවාසිකම් දිනය පාරිභෝගික කණ්ඩායම් සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ එක්ව සමරනු ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සහ පනතෙහි නීති රීති සම්බන්ධයෙන් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- වගු අංක **5 -** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙහෙයවන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්

| පළාත | දිස්ත්‍රික්කය | ව්‍යාපාරික දැනුවත් කිරීම් | සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම් | පාසැල් ශිෂ්‍ය දැනුවත් කිරීම් |
|---|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 12 | 07 | 05 |
| | මාතලේ | 19 | 05 | 01 |
| | නුවරඑළිය | 12 | 12 | 12 |
| නැගෙනහිර පළාත | අම්පාර | 10 | 08 | 17 |
| | මඩකලපුව | 12 | 13 | 22 |
| | ත්‍රිකුණාමලය | 17 | 32 | 15 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 06 | 13 | 01 |
| | පොළොන්නරුව | 11 | 09 | 01 |
| උතුරු පළාත | යාපනය | 12 | 11 | 17 |
| | කිලිනොච්චි | 21 | 05 | 10 |
| | මන්නාරම | 20 | 07 | 15 |
| | මුලතිව් | 26 | 03 | 08 |
| | වව්නියාව | 26 | 09 | 20 |
| වයඹ පළාත | කුරුණෑගල | 01 | 05 | 01 |
| | පුත්තලම | 09 | 12 | 02 |
| සබරගමු පළාත | කෑගල්ල | 05 | - | 08 |
| | රත්නපුර | 11 | 29 | 08 |
| දකුණු පළාත | ගාල්ල | 11 | 32 | 08 |
| | හම්බන්තොට | 14 | 41 | 05 |
| | මාතර | 12 | 26 | 13 |
| ඌව පළාත | බදුල්ල | 08 | 17 | 03 |
| | මොණරාගල | 13 | 04 | - |
| බස්නාහිර පළාත | කොළඹ | 20 | 19 | 07 |
| | ගම්පහ | 10 | 06 | 02 |
| | කළුතර | 09 | 30 | 05 |
| **මුළු සංඛ්‍යාව** | | **327** | **355** | **206** |

වගු අංක – **6** - පාරිභෝගික සංවිධාන ස්ථාපනය කිරීම

| පළාත | දිස්ත්‍රික්කය | පාරිභෝගික සංවිධාන | | පාසල් පාරිභෝගික කව | |
|---|---|---|---|---|---|
| | | ස්ථාපනය කරන ලද | ලියාපදිංචි කරන ලද | ස්ථාපනය කරන ලද | ලියාපදිංචි කරන ලද |
| මධ්‍යම පළාත | මහනුවර | - | - | - | - |
| | මාතලේ | - | - | 01 | - |
| | නුවරඑළිය | - | - | 03 | - |
| නැගෙනහිර පළාත | අම්පාර | 01 | - | 05 | 01 |
| | මඩකලපුව | 03 | 08 | 10 | 06 |
| | ත්‍රිකුණාමලය | - | - | 10 | - |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | - | - | - | - |
| | පොළොන්නරුව | - | - | - | - |
| උතුරු පළාත | යාපනය | 01 | - | 05 | - |
| | කිලිනොච්චි | - | - | 03 | 01 |
| | මන්නාරම | - | - | 12 | 06 |
| | මුලතිව් | - | - | 01 | - |
| | වව්නියාව | - | - | 19 | 15 |
| වයඹ පළාත | කුරුණෑගල | - | - | 01 | - |
| | පුත්තලම | - | - | - | - |
| සබරගමු පළාත | කෑගල්ල | - | - | 04 | - |
| | රත්නපුර | - | - | 06 | - |
| දකුණු පළාත | ගාල්ල | - | - | 01 | 01 |
| | හම්බන්තොට | 01 | 03 | 01 | - |
| | මාතර | - | - | 02 | - |
| ඌව පළාත | බදුල්ල | - | - | - | - |
| | මොණරාගල | - | - | - | - |
| බස්නාහිර පළාත | කොළඹ | - | - | 02 | 01 |
| | ගම්පහ | - | - | - | - |
| | කළුතර | - | - | 01 | 01 |
| මුළු සංඛ්‍යාව | | **06** | **11** | **87** | **32** |

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**



ගම්පහ සමූපකාර කාන්තා සංවිධාන සමාජිකාවන් දැනුවත්කිරීමේ වැඩසටහනක් පවත්වමින්



ආරක්ෂක හිස්වැසුම් නිෂ්පාදකයින් සහ පාර්ශවකරුවන් සමඟ විශේෂ සාකච්ඡාවක් පවත්වමින්



කොළඹ මහජන පුස්තකාලයේ පැවති එකෝ- වී ප්‍රදර්ශනයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රදර්ශන කුටිය



අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවත්වූ වාණිජ්‍යය ගුරුවරුන් දැනුවත්කිරීමේ වැඩසටහන

5. **තරඟවිරෝධී චර්යා කටයුතුවලින් වෙළෙඳුන් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සහ යහපත් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම**

| ක්‍රියාකාරකම | මුළු සංඛ්‍යාව |
|---|---|
| <u>වෙළඳ පැමිණිලි පිළිබඳ විමර්ශන</u><br>ප්‍රති තරඟකාරී මෙන්ම අසාධාරණ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත යොමු කළ පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීම<br>• පෙර යොමුකරන ලද පැමිණිලි<br>• අදාළ කාලය තුළදී ලද පැමිණිලි<br>• සභාව වෙත යොමු කරන ලද පැමිණිලි<br>• වර්ෂය තුළ ඉවත් කරන ලද පැමිණිලි<br>• දැනට කටයුතු කරනු ලබන පැමිණිලි | <br><br><br><br>01<br>28<br>02<br>23<br>04 |
| <u>සැමදෙනාටම සාර්ථක වීම සඳහා අවස්ථා උදාකරමින් තරඟකාරීත්වය වැඩි කිරීම</u><br>2017/07/11 දින නිකුත් කළ අංක 1505/15 දරන ගැසට් නිවේදනය මඟින් හඳුනා ගන්නා ලද නිෂ්පාදන පහක් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම<br>• ලැබූ අයදුම්පත් සංඛ්‍යාව<br>• අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම<br>• එකතු කරන ලද සෙස් බදු (රු. 000)<br>• | <br><br><br>391<br>391<br>1029199283 |
| <u>අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පරීක්ෂා කිරීම</u><br>• කොළඹ සහ තදාසන්න ප්‍රදේශ පදනම් කරගත් 18/20 වගන්තියේ වාර්තාව<br>• දිස්ත්‍රික් මට්ටමෙන් විශ්ලේෂණය සහ වාර්තාකිරීම | <br>12<br><br>12 |

| | |
|---|---|
| <u>ආහාර ද්‍රව්‍යවල මිල පරීක්ෂා කිරීම</u><br>දෛනික එළවළු සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>දෛනික මාළු මිල දැක්වෙන වාර්තා<br>අත්‍යවශ්‍ය භාණ්ඩවල සිල්ලර මිල දැක්වෙන වාර්තා<br>විශේෂ වාර්තා | <br>255<br>193<br>255<br>79 |
| පර්යේෂණ අධ්‍යයන | පිළිකා රෝගය සඳහා ඖෂධ – 01 (අවසන් කර තිබේ)<br>කිරි නිෂ්පාදන - 01(ක්‍රියාත්මක වෙමින් පවතී ) |
| විශේෂ අධ්‍යයන | සීනි, පාවහන්, බෝතල්කළ පානීය ජලය, ලූණු, කුකුළු මස්, මස්, ආනයනිත පොත් |
| දැනුවත්කිරීම් පැවැත්වීම් | වැඩසටහන් 11 |

**අන්තර් ක්‍රියාකාරී ජංගම සේවය (1977)**

අන්තර් ක්‍රියාකාරී ජංගම දුරකථන ප්‍රතිචාර සේවාව තුළින් (කෙටි කේතාංක 1977) පුරවැසියන් වෙත සිල්ලර මිල තොරතුරු ලබා දෙනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් ස්වකීය කෙටි කේතාංක දුකථන අංකය වන 1977 භාවිතාකර කොළඹ පිටකොටුව, දෙමටගොඩ, බොරැල්ල, නුගේගොඩ සහ වැල්ලවත්ත ආදී වෙළඳපොළවල එළවළු, පළතුරු සහ ආහාර ද්‍රව්‍ය සිල්ලර මිලගණන් දෛනිකව මෙම තොරතුරු පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. මෙමගින් පාරිභෝගිකයන්ට තමන්ට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ දී දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගතහැකිය.

**වෙනත් නියාමන අධිකාරීන් සහ පාර්ශවකාර සංවිධාන සමඟ ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීම සහ පවත්වා ගැනීම**

**01) මහවැලි සංවර්ධන සහ පරිසර අධිකාරිය**

අ. පරිසර ආරක්ෂණය සඳහා වන අමාත්‍යාංශ කමිටු

- ජාතික මෙහෙයුම් කමිටුව (බැසිල් / රොටර්ඩෑම්/ ස්ටොක්හෝම් සමුළු / මිනමාටා සමුළුව)
- ජාතික සම්බන්ධීකරණ කමිටුව
- ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ
- ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති කමිටුව
- ගෝලීය සුසංවාදීකරණ පද්ධති සමාලෝචන කමිටුව (HS කේතාංකය )
- අන්තර් ආයතන විශේෂඥ කාර්ය කණ්ඩායම(IAEWG) – SWITCH ASIA වැඩසටහන
- තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය

ආ. මධ්‍යම පරිසර අධිකාරිය

- රසායනික ද්‍රව්‍ය නිසි කළමනාකරණය සඳහා ජාතික ක්‍රියාත්මක සැලසුම සමාලෝචනය කිරීමේ කමිටුව.
- TACMIC – කාර්මික රසායනික කළමනාකරණය සඳහා වන තාක්ෂණික උපදේශන කමිටුව

**02) ජන සන්නිවේදන සහ ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය**

GIC 1919 සඳහා වන මෙහෙයුම් කමිටු සාමාජික (PSC)

**03) ශ්‍රී ලංකා රේගුව**

රේගුවේ තනි කවුළු පද්ධතිය සමඟ සම්බන්ධ වීම.

**04) වෙළෙඳ සංගම් සහ කර්මාන්ත මණ්ඩල**

තරඟකාරීත්වය සහතික කිරීම සඳහා මිත්‍රශීලී සම්බන්ධතා පවත්වාගැනීම

**05) සෞඛ්‍ය අමාත්‍යාංශය**

ආහාර උපදේශක කමිටු සාමාජික

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

**06) මුදල් අමාත්‍යාංශය**

ජීවන වියදම් කමිටු රැස්වීම

**07) කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය**

කුළුබඩු පිළිබඳ උපදේශක කමිටුව

**සාධාරණ මිලකරණය සහතික කිරීම**

**නිශ්චිත භාණ්ඩවල මිල නියාමනය**

අ. පනතෙහි 18, 19 සහ 20 වගන්ති මඟින් පවරා ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හඳුනාගත් භාණ්ඩවල වෙළෙඳපොළ මිල සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කරයි. තෝරාගත් භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත අංක 7 වගුව මඟින් දැක්වේ.

**වගු අංක – 7 - නිශ්චිත භාණ්ඩවල මිල ස්ථායිකරණය / නියමකිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග**

| භාණ්ඩය | ගන්නා ලද ක්‍රියාමාර්ග |
|---|---|
| සිමෙන්ති | සිමෙන්ති සඳහා වන අයදුම්පත්‍ර 22කට තීරණ ලබාදී ඇත. |
| යොදය සහිත කිරිපිටි | යොදය සහිත කිරිපිටි සඳහා වන 10 කට තීරණ ලබාදී ඇත. |
| ඖෂධ | ඖෂධසඳහා වන අයදුම්පත්‍ර 38කට තීරණ ලබාදී ඇත. |

**අතුරු නියෝග**

| භාණ්ඩය | අයදුම්පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| සිමෙන්ති | 05 |
| ඖෂධ | 03 |

**ආයතනය තුළ ශාඛ්‍යතා සංවර්ධනය**

ආ . සේවක සංවර්ධනය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සේවකයින් අදාළ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය වීම ස්වකීය සේවාවන් ඉහළ නැංවීම සඳහා දායකත්වය සපයන ආයෝජනයක් වශයෙන් සලකනු ලැබේ. 2016 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගු අංක 8 මඟින් දැක්වේ.

**වගු අංක– 8 - 2016 වර්ෂයේදී පවත්වන ලද කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන වැඩසටහන්**

| # | පාඨමාලාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ගිණුම්කරණ ආයතනයේ වාර්ෂික සමුළුව | 01 |
| 02 | කථන ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | 01 |
| 03 | රාජ්‍ය නිලධාරීන් සඳහා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවය ශක්‍යතා වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර අධිශිෂ්‍යත්ව වැඩසටහන - කොරියාව | 01 |
| 04 | ආයතනික ඉංග්‍රීසි පාඨමාලාව | 60 |
| 05 | පාරිභෝගික ගැටළු සහ පාරිභෝගික වගකීම් පිළිබඳ ජාත්‍යන්තර පුහුණුව | 01 |
| 06 | නීතිය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 01 |
| 07 | ජාතික මානව සම්පත් සමුළුව 2016 | 01 |
| 08 | ජාතික කළමනාකරණ සමුළුව 2016 | 01 |
| 09 | පුස්තකාලයාධිපතිවරුන් සඳහා එක්දින වැඩමුළුව | 01 |
| 10 | ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 | 01 |
| 11 | ලේකම් පරිචය පිළිබඳ පාඨමාලාව | 01 |
| 12 | සංවර්ධනය වෙමින් පවතින රටවල පාරිභෝගික ආරක්ෂණ සංවිධාන පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | 01 |
| 13 | ආහාර පිළිබඳ නියම සහ ආචාරධර්මීය ව්‍යාපාර කටයුතු පිළිබඳ සම්මන්ත්‍රණය | 02 |
| 14 | පුස්තකාල තොරතුරු ජාල පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 15 | Belt & Road සංවර්ධන උපායමාර්ගය සඳහා වන වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීමේ සම්මන්ත්‍රණය - චීනය | 01 |
| 16 | ජලයේ ගුණාත්මකභාවය සහ මිනිස් සෞඛ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 |
| 17 | ලේකම් කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 |
| 18 | ආහාරවල ෂෞඛ්‍යාරක්ෂිතභාවය සහ GMP පිළිබඳ පුහුණු වැඩසටහන | 05 |
| 19 | "පාරිභෝගික සුරක්ෂිතතාව සඳහා යහපත් කෘෂිකාර්මික මෙන්ම පසු අස්වනු කාර්යයන්" පිළිබඳ වැඩමුළුව | 01 |

ආ. අධිකාරියේ සේවක මණ්ඩලය ශක්තිමත් කිරීම

| වැටුප් කේතාංකය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සේවයේ නිරත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| **HM 2-1** | **ජ්‍යෙෂ්ඨ කළමණාකාර** | | |
| | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 |
| **HM 1-1** | අධ්‍යක්ෂ | 6 | 6 |
| | සභාවේ ලේකම් | 1 | 1 |
| **MM 1-1** | **කළමණාකාර** | | |
| | අභ්‍යන්තර විගණක | 1 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 15 | 5 |
| | සහකාර අධ්‍යක්ෂ | | 4 |
| | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ-ප්‍රාදේශීය | 9 | 7 |
| **JM 1-1** | **කණිෂ්ඨ කළමණාකාර** | | |
| | විගණන නිලධාරී | 2 | 0 |
| | පද්ධති පාලක | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 27 | 25 |
| | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ වෙළඳ පර්යේෂක සහ විශ්ලේෂක | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | 2 | 1 |
| | රහස්‍ය ලේකම් (අධ්‍යක්ෂ ජෙනරාල්) | 1 | 0 |
| | රහස්‍ය ලේකම් (සභාපති) | 1 | 1 |
| | ජ්‍යෙෂ්ඨ පරිපාලන/ මානව සම්පත් නිලධාරී | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ නීති සහ බලගැන්වීම් නිලධාරී | 2 | 2 |
| | ජ්‍යෙෂ්ඨ පිරිවැය නිලධාරී | 1 | 1 |
| **MA 5-2** | **බලගැන්වීම් / මෙහෙයුම්/ සේවා දිගු** | | |
| | දත්ත සම්බන්ධීකාරක | 1 | 1 |
| | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 1 |
| | වෙළෙඳපොළ විමර්ශන නිලධාර | 1 | 1 |
| | ප්‍රලේඛන නිලධාරී | 6 | 4 |
| | පුස්තකාලයාධිපති | 1 | 1 |
| | පිරිවැය නිලධාරී | 15 | 2 |
| | ගිණුම් නිලධාරී | | 6 |
| | පරිපාලන නිලධාරී | 5 | 4 |
| | නීති සහ බලගැන්වීම් නිලධාරී | 3 | 3 |
| | විමර්ශන නිලධාරී | 200 | 188 |

| | | | |
|---|---|---|---|
| **MA 2-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ)** | | |
| | පොත් තබන්නා | 1 | 0 |
| **MA 1-2** | **කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)** | | |
| | කළමනාකරණ සහකාර | 31 | 31 |
| **PL 3** | **ප්‍රාථමික මට්ටමේ කුසලතා සහිත** | | |
| | රියදුරු | 18 | 18 |
| **PL 1** | **ප්‍රාථමික මට්ටමේ කුසලතා රහිත** | | |
| | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |
| | **එකතුව** | **370** | **328** |

ඈ. කාර්යමණ්ඩල අභිප්‍රේරණය සහ ශුභසාධනය

සමාලෝචිත වර්ෂය තුළදී සේවකයින්ට ප්‍රසන්න මෙන්ම සේවයට හිතකර වාතාවරණයක් සැපයීම සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, ආගමික සහ සංස්කෘතික වැඩසටහන්, සේවක දිරිදීමනා ක්‍රමය, සේවක සංවර්ධන වැඩසටහන් සහ සේවක හඳුනාගැනීම් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## ඇ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සඳහා සංශෝධන

සංශෝධන නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඒ සම්බන්ධ අවසන් තීරණයකට එළඹ තිබේ.

### පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර, අධිකාරිය විසින් සභාව වෙත කරනු ලබන යොමුකිරීම්, ප්‍රධාන වශයෙන් ප්‍රති තරඟකාරීත්ව චර්යාවන් ආශ්‍රිත ක්ෂේත්‍රයන් නිශ්චය කිරීම සඳහා පනත මඟින් බලය පවරා තිබේ.පනතේ විධිවිධාන ප්‍රකාර අධික මිල ගණන්, වෙළෙඳපොළ අඩුපාඩු සහ වෙළෙඳපොළ හැසිරවීම් විමර්ශන කටයුතු සඳහා සභාව වෙත යොමු කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී භාණ්ඩ අලෙවි කළයුතු මෙන්ම සේවා සැපයිය යුතු මිල ගණන් නිර්දේශ කිරීමට සභාව වෙත බලය පැවරී තිබේ.

පැමිණිලි / යොමුකිරීම්

| **ක්‍රියාකාරකම** | **ලැබූ පැමිණිලි සංඛ්‍යාව** | **තීන්දුව ලබාදුන් / විසඳූ හෝ වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව (පූර්ව වර්ෂය ද ඇතුළත්ව)** |
|---|---|---|
| ජනතා අභිලාෂයට විරුද්ධව ක්‍රියාත්මක වන ප්‍රති තරඟකාරී ක්‍රියාකාරකම් සමනය කිරීම තහවුරු කිරීම. | 02 | 02 |
| භාණ්ඩ හා සෙවා සඳහා උපරිම මිල නිර්දේශ කිරීම | 03 | 03 |
| අධික මිල ගණන් සම්බන්දයෙන් විමර්ශන සිදුකිරීම | 02 | - |

(පූර්ව වර්ෂයේ පැමිණිලි ද ඇතුළත්ව)

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | 2016.12.31 දිනට රුපියල් | 2015.12.31 දිනට රුපියල් |
|---|---|---|
| **වත්කම්** | **000'** | **000'** |
| **ජංගම වත්කම්** | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 15,432 | 21,765 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 18,282 | 17,684 |
| භාණ්ඩ ලැයිස්තු / තොග | 1,031 | 1,253 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 5,523 | 5,343 |
| | **40,269** | **46,045** |
| ක්‍රියාත්මක කාර්යයන් (සංවර්ධන පියවර) | 121 | 1,603 |
| **ජංගම නොවන වත්කම්** | | |
| ආයෝජන | 218,495 | 195,181 |
| | 18,737 | 17,679 |
| ජංගම නොවන වෙනත් මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය) | 6,333 | 8,288 |
| කුළියට දෙන ලද ගොඩනැඟිලි | 850 | 875 |
| දේපළ, රියත සහ උපකරණ | 86,123 | 96,406 |
| | **330,538** | **318,429** |
| **මුළු වත්කම්** | **370,928** | **366,076** |
| **වගකීම්** | **-** | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත වගකීම් | 32,726 | 26,875 |
| ගෙවියයුතු සහ අනෙකුත් වගකීම් | 2,199 | 4,475 |
| | **34,926** | **31,350** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 45,579 | 40,146 |
| **මුළු වගකීම්** | **80,505** | **71,496** |
| | | |
| **මුළු ශුද්ධ වත්කම්** | **290,423** | **294,580** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | **-** | |
| සමුච්චිත අරමුදල | 63,191 | 63,191 |
| විලම්භිත ආදායම | 71,790 | 93,201 |
| සංචිත | 155,442 | 138,189 |
| | **290,423** | **294,580** |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | **290,423** | **294,580** |

මූල්‍ය ප්‍රතිපත්ති සහ සටහ න් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි පූර්ණ කොටසක් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ මූල්‍ය
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

අධ්‍යක්ෂ ජනරාල්
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

සභාපති
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**
**2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | 2016.12.31 දිනට රුපියල් 000' | 2015.12.31 දිනට රුපියල් 000' |
|---|---|---|
| **ආදායම්** | | |
| පුනරාවර්තන ප්‍රදාන | 292,000 | 287,647 |
| දඩමුදල් ආදායම් | 29,979 | 26,621 |
| වෙනත් ආදායම් | 50,760 | 42,647 |
| | **372,739** | **356,915** |
| **වියදම්** | | |
| පුද්ගල වැටුප් පඩිනඩි | (221,315) | (219,520) |
| ගමන් වියදම් | (13,515) | (9,009) |
| සැපයුම් සහ පරිභෝජන භාණ්ඩ පිරිවැය | (10,591) | (10,325) |
| නඩත්තු පිරිවැය | (9,681) | (5,785) |
| ගිවිසුම්ගත සේවා | (41,693) | (42,404) |
| වත්කම් ක්ෂයවීම් | (33,410) | (29,797) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (36,106) | (25,358) |
| මූල්‍ය පිරිවැය | (136) | (130) |
| මුළු වියදම් | **(366,448)** | **(342,328)** |
| | **6,292** | **14,587** |
| වත්කම් අපහරණයෙන් ලද අලාභය | (21) | |
| **කාල පරිච්ඡේදය සඳහා පූර්ණ ශුද්ධ අතිරික්තය /(ඌන)** | **6,271** | **14,587** |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**
**2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | 2016<br>රු. 000' | 2015<br>රු. 000' |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය ක්‍රියාවලින් ලද අතිරික්තය/ (හිඟය) | 6,292 | **12,731** |
| **ගැලපුම්** | | |
| වත්කම් අපහරණයෙන් ලාභ /(අලාභ) | (21) | |
| ක්ෂයවීම් | 33,410 | 29,797 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 6,939 | 14,127 |
| ක්‍රමක්ෂය | 25 | 25 |
| අස්පෘශ්‍ය වත්කම් ඉහළයාම (ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන්) | 1,481 | 200 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **48,126** | **56,880** |
| ගෙවිය යුතු මුදල් ඉහළයාම | 3,576 | 4,740 |
| ජංගම වත්කම් ඉහළයාම | (496) | (762) |
| පාරිතෝෂික ගෙවීම් | (1,506) | (156) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **49,700** | **60,702** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| පිරියත සහ උපකරණ මිලදීගැනීම් | (12,208) | (11,368) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | (1,057) | (998) |
| ආයෝජන ඉහළයාම | (23,314) | (26,524) |
| දීර්ඝ කාලීන ණය පහළයාම්(සේවක ණය) | 1,956 | (68) |
| ආයෝජන කටයුතු මඟින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | **(34,623)** | **(38,758)** |
| මූල්‍ය කටයුතු මඟින් ලද මුදල් ප්‍රවාහ | | |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන | 12,000 | 11,368 |
| වත්කම් ක්ෂයවීම් | (33,410) | (29,797) |
| විලම්භිත ආදායම | (21,410) | (18,429) |
| මූල්‍ය කටයුතු මඟින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **(21,410)** | **(18,429)** |
| මුදල් හා මුදල් සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ ඉහළයාම් (පහළයාම) | **(6,333)** | **4,172** |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | **21,765** | 17,593 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | **15,432** | **21,765** |

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**2016/12/31 දිනට හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය**

| | | | **රු.'000** |
|---|---|---|---|
| **විස්තරය** | **අයිතිකරුවන් වෙත පැවරිය හැකි හිමිකම** | | |
| | **දායක ප්‍රාග්ධනය** | **සමුච්චිත අතිරික්ත / ඌනතා** | **මුලු ශුද්ධ වත්කම් / වගකීම්** |
| **2016/01/01/ දිනට ශේෂය** | **93,200** | **201,381** | **294,581** |
| සංශෝධිත අතිරික්තය** | - | 10,981 | **10,981** |
| **සංශෝධිත ශේෂය** | **93,200** | **212,362** | **305,562** |
| **2016 වර්ෂයේ දී ශුද්ධ වත්කම් / වගකීම්වල වෙනස්වීම්** | | | |
| භාණ්ඩාගාර දායකත්වය (ප්‍රාග්ධන) | 12,000 | | **12,000** |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය වීම | (33,410) | | **(33,410)** |
| වර්ෂය සඳහා අතිරික්තය ඌනතාව | | 6,271 | **6,271** |
| **2016/12/31 දිනට ශේෂය** | **71,790** | **218,633** | **290,423** |

** පූර්ව වර්ෂයේ ගැලපීම්: රු.1,856,109 /- මුදල පහත සංඛ්‍යාවන්ගෙන් සමන්විත වේ.

| - | **2015.12.31** දිනට ප්‍රතිපාදන | **2015.12.31** දිනට සත්‍ය වියදම | ජ'නල්. අංකය | ගිණුම සඳහා ශුද්ධ බලපෑම (අධි / ඌන ප්‍රතිපාදන | **2015.12.31** දිනට ප්‍රකාශිත ශේෂය | **2015.12.31** දිනට සංශෝධිත ශේෂය |
|---|---|---|---|---|---|---|
| **ගමන් වියදම්** | | | **-** | | 10,216,351 | |
| ගමන් වියදම් සහ යැපීම් දීමනා | 3,582,214 | 2,371,707 | **141** | (1,210,507) | | |
| **අනු එකතුව** | | | | **(1,210,507)** | | **9,005,844** |
| **සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ** | | | **-** | | 10,368,524 | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ | 44,071 | 16,962 | **141** | (27,108) | | |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 416,748 | 400,598 | **141** | (16,150) | | |
| **අනු එකතුව** | | | | **(43,258)** | | **10,325,266** |
| **නඩත්තු කටයුතු** | | | **-** | | 5,828,985 | |
| කාර්යාල නඩත්තු කටයුතු | 72,000 | 35,917 | **141** | (36,083) | | |
| කාර්යාල උපකරණ නඩත්තු | 25,600 | 17,219 | **141** | (8,381) | | |
| **අනු එකතුව** | | | | **(44,463)** | | **5,784,522** |
| **ගිවිසුම්ගත සේවා** | | | **-** | | 42,740,463 | |
| විදුලිය | 229,423 | 2,156 | **141** | (227,267) | | |
| කුළී ගාස්තු - වාහන | 2,083,555 | 1,621,915 | **141** | (461,640) | | |
| දුරකථන | 611,997 | 591,798 | **141** | (20,199) | | |
| ජලය | 40,924 | 32,140 | **141** | (8,784) | | |
| **අනු එකතුව** | | | | **(717,890)** | | **42,022,573** |
| **වෙනත් මෙහෙයුම් වියදම්** | | | **-** | | 25,339,872 | |
| නියැදි (සාම්පල) පරීක්ෂාව | 400,000 | 800,000 | **142** | 400,000 | | |
| **අනු එකතුව** | | | | **400,000** | | **25,739,872** |
| **පුද්ගල පඩිනඩි** | | | **-** | | | |
| දීමනා | 134,015 | 104,015 | **141** | (30,000) | 219,760,209 | |
| අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 524,165 | 314,174 | **141** | (209,991) | | |
| **අනු එකතුව** | | | | **(239,991)** | | |
| | | | | - | - | **219,520,218** |
| **2015 සංචිතය සඳහා ගැළපීම්** | | | | **(1,856,109)** | **136,286,844** | **138,142,953** |

## ගිණුම්කරණ සටහන්

**1.** ඒකාබද්ධ තොරතුරු

**1.1** 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත , 1987 අංක 1 දරන පාරිභෝගික සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ මිල පාලන පනත (173 පරිච්ඡේදය) අවලංගු කරමින් 203 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය පිහිටුවන ලදී.

2011 සැප්තැම්බර් මස 15 වන දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක.PED/58/02 ප්‍රකාරව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය “A” කාණ්ඩයේ නියාමන නියෝජිතායතන අතර “A” උප කාණ්ඩයට වර්ගීකරණය කර ඇත.

**1.2** ප්‍රමුඛ කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ පාරිභෝගිකයින් ආරක්ෂාකිරීම සහ වෙළඳාම විධිමත් කිරීමකි.

**1.3** 2016 වර්ෂය අවසාන වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව 353 ක් විය.

**1.4** කොටස් හිමිකාරීත්වය / හිමිකම

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදලින් යැපෙන ආයතනයකි. අධිකාරිය වෙත සෘජුවම ලැබෙන ආදායමක් වූ දඩ මුදල් ආදායමෙන් 1/3 ක මුදල ඇතිකරන ලද අරමුදලේ ශුද්ධ ශේෂය මඟින් ද අධිකාරියේ හිමිකම් නිරූපණය කෙරේ.

**1.5** රජයේ ප්‍රදාන

ලැබෙන ප්‍රදානයන් සහතිකයක් වශයෙන්ම ලැබේනම් එය රජයේ ප්‍රදානයක් වශයෙන් හඳුනාගනු ලැබේ. ප්‍රදානයන් වියදම් අයිතමයන් හා සම්බන්ධයක් වේ නම් එය වර්ෂය සඳහා වන ආදායම වශයෙන් සලකයි. ප්‍රදානය වත්කමක් සඳහා වන්නේ නම් අදාළ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ජීවකාලයට සමාන අගයක් ආදායම වශයෙන් සලකා ගණනය කරයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මූල්‍යමය නොවන ප්‍රදාන ලබන විට වත්කම සහ ප්‍රදානය නාමික අගයන් වශයෙන් ගැනෙන අතර සමාන වාර්ෂික වාරික වශයෙන් අදාළ වත්කම ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය අනුව අපේක්ෂිත ජීවකාලය තුළ ලාභ හෝ අලාභ වශයෙන් සලකනු ලබයි.

රජයේ ප්‍රදාන හා සම්බන්ධ වත්කම් හා මූල්‍ය නොවන ප්‍රදානයන්හි සාධාරණ අගය ශේෂ පත්‍රයෙහි විලම්භිත ආදායමෙන් දක්වා ඇත.

**2.** **පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට (SLPSAS) අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගිණුම් ප්‍රකාශ පිළියෙළ කර තිබේ.

**2.2** ඓතිහාසික පිරිවැය පදනම සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් පාදක කරගෙන මූල්‍ය ඇස්තමේන්තු සකස් කර තිබේ.

**2.3** දඩ මුදල් ආදායම

**2.3.1** අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා දඩ මුදල් උපයෝගී කර නොගන්නා බැවින් පෙර ආදායම් ප්‍රකාශන සැකසීමේ දී දඩ මුදල් ආදායම සැලකිල්ලට නොගන්නා ලදී. 2011 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අධිකාරිය විසින් එකී මුදල් ප්‍රයෝජනයට ගන්නා ලදී. එමනිසා දඩ මුදල් උපයනු ලබන ආදායමක් වශයෙන් සලකන ලද අතර දඩ මුදල් ආශ්‍රිත සියලු වියදම් සහ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා තිබේ.

**2.3.2** අධිකාරිය විසින් දඩ මුදල් ආදායම් වශයෙන් මුදල් ලැබුවද අදාළ වැටලීම සිදුකළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි නිලධාරියා විසින් ලබා දෙන ලද නඩු අංකයන් අදාළ අධිකරණය විසින් මුදල් එවීමේදී ලබාදෙනු ලබන අංක (තොරතුරු) හා එකිනෙකට වෙනස්වීම හේතුවෙන් ඒවා එම අවස්ථාවේදීම දඩ මුදල් වශයෙන් හඳුනා නොගැනෙන අවස්ථා පවතියි. එම මුදල් සත්‍ය වශයෙන්ම අධිකාරිය සතුවිය යුතු මුදල්ද නැතහොත් අධිකරණ විසින් වැරදීමකින් එවන ලද මුදල්ද යන්න නිවැරදිව දැනගැනීම වන තෙක් තාවකාලික දඩමුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. එබඳු මුදල් ඊළඟ වර්ෂය අවසන් වනතෙක් නිශ්චිතව හඳුනා නොගන්නේ නම් අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණ අරමුදලට බැර කරනු ලැබේ.

**2.4** මුදල් වර්ෂය

අධිකාරියේ මූල්‍ය වර්ෂය ලෙස දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය සලකනු ලැබේ.

**3.** **වත්කම් පදනම් සහ ඒවායේ අගය තක්සේරු කිරීම**

**3.1** දේපළ, පිරියත සහ උපකරණ

**3.1.1.** පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගිණුම් ඇස්තමේන්තු සැකසීම සඳහා ගිණුම් ප්‍රතිපත්ති සහ අනාගත හඳුනාගැනීම ලෙස පිරිවැය ආකෘතිය තෝරාගනියි. (SLPSAS 7)

**3.1.2** දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අගය දැක්වීමේ දී ඒවායේ ශුද්ධ සමුච්චිත ක්ෂයවීමට දේපළ, පිරියත සහ උපකරණ කොටස් ප්‍රතිස්ථාපනය කිරීම ද අන්තර්ගත වේ. දේපළ, පිරියත සහ උපකරණ ආදියෙහි අතිශය වැදගත් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට ඇතිවිට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිනොගෙන නව කොටස ආශ්‍රිත ජීවකාලය සහ ක්ෂයවීම හඳුනා ගනියි. අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා වැය කරන ලද ආකාරය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වත්කම් ප්‍රත්‍යාගණ සංචිතයෙහි සමුච්චිත හිමිකම් වශයෙන් දැක්වේ.

**3.1.3** වත්කම් අපේක්ෂිත ක්‍රියාකාරී තත්ත්වයට අවශ්‍ය පරිදි සකස් කිරීම සඳහා ඕනෑම වියදමක් දරමින් සිදු කරනු ලබන මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් සඳහා වන පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වැය වන පිරිවැය වේ.

**3.1.4** කාර්යයන් ක්‍රියාත්මකකිරීම හෝ වත්කම්වල ජීවකාලය ඉහළ නැංවීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කරගැනීම, පුළුල්කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකනු ලැබේ.

**3.1.5** පහත දැක්වෙන ස්ථාවර වත්කම්හි ආර්ථික ප්‍රතිලාභ සහ ඵලදායී ජීවකාලය පැවතුණ ද ඒවායේ අගය 2016/01/01 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති බැවින් වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා පත්කරන ලද කමිටුවක් විසින්මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය පහත පරිදි ප්‍රති ඇස්තමේන්තුගත කරන ලදී.(SLPSAS 3)

| වත්කම් | 2016/1/1/ දිනට අගය | 2016/1/1/ දිනට සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ අගය | 2016/1/1/ ට පවතින ජීව කාලය | ප්‍රති ඇස්තමේන් තුගත ජීවකාලය | 2016.01.01 දිනට SLPSAS 03 අනුව ප්‍රතිඇස්තමේන් තුගත ශේෂය |
|---|---|---|---|---|---|---|
| කාර්යාල ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 865,184.77 | 844,459.00 | 20,725.57 | 10 | 15 | **288,394.92** |
| කාර්යාල උපකරණ | 1,269,648.66 | 1,269,648.66 | - | 10 | 15 | **423,216.22** |
| පරිගණක උපකරණ | 2,338,891.05 | 2,109,678.87 | 229,212.18 | 5 | 8 | **877,084.14** |
| පරිගණක මෘදුකාංග | 1,497,536.00 | 1,486,735.00 | 10,801 | 5 | 8 | **561,576.00** |
| මෝටර් වාහන | 11,550,000.00 | 11,550,000.00 | - | 5 | 10 | **5,775,000.00** |
| කාර්යාල වෙන්කිරීම් | 6,113,160.07 | 6,113,156.04 | 4.03 | 5 | 10 | **3,056,576.01** |
| මුළු අගය | **23,634,488.65** | **23,373,677.57** | **260,742.78** | | | **10,981,847.29** |

**3.1.7** **ක්‍රියාත්මක වන කාර්යයන්**

**3.1.7.1** (රු.43, 750.00)

මෘදුකාංග වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම මුදල් වියදම් කළ ඇති බව මෙමගින් දැක්වේ.

| | **ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.)** | **අවසන් කළ කාර්යයන් (රු.) (WIP)** | **2016.12.31.දිනට අවසන් කළ යුතු / සහතික කළයුතු ශේෂ කාර්යයන් සඳහා (රු.)** |
|---|---|---|---|
| මානව සම්පත් මෘදුකාංගය | 165,000.00 | 121,250.00 | 43,750.00 |
| එකතුව | **165,000.00** | **121,250.00** | **43,750.00** |

**3.1.7.2** ඖෂධ 1,481,250.00

ඖෂධ විශේෂ භාණ්ඩයක් වශයෙන් හඳුනාගැනීම හේතුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඖෂධ මිලකරණය සඳහා 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෘදුකාංගයක් වැඩිදියුණු කරන ලදී. රජය විසින් ඖෂධ වර්ග පාලනය අරමුණු කරගනිමින් 2015 වර්ෂයේ දී ජාතික ඖෂධ නියාමන අධිකාරිය ස්ථාපනය කරන ලදී. මේවන විට ඖෂධ මිල පාලනය කරනු ලබන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසිනි. එබැවින් ඖෂධ පිළිබඳ මෘදුකාංගය ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත පැවරීමට අප උත්සාහ කළ ද එය අසාර්ථක විය. එබැවින් මෘදුකාංගයේ ශේෂ කොටස සම්පූර්ණ නොකිරීමටත් ඒ සඳහා ගෙවීම් සිදු නොකිරීමටත්, අප විසින් මෘදුකාංගය සංවර්ධනය කරන ලද පුද්ගලයා සමඟ අන්‍යොන්‍ය එකඟතාවයට පැමිණ තිබේ. එමනිසා සංවර්ධනය කරන ලද මෘදුකාංගය දත්ත සංචිතයක් වශයෙන් භාවිතා කිරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තීරණය කර ඇති අතර සම්පූර්ණ කරන ලද කොටස අවසන් නිපැයුම වශයෙන් සළකා ගිණුම්ගත කරතිබේ. තව ද ශේෂය ආදායම් වියදම් ගිණුමට බැර කර තිබේ.

**3.2** **ක්ෂයවීම්**

සියලුම වත්කම් අධිකාරියේ භාවිතයට යොදාගත් දිනෙන් ආරම්භ වන මාසයේ සිට ක්ෂය ගණනය කරනු ලැබේ.

**3.2.1** 3.1.5 සටහනෙහි දක්වා ඇති අයිතම හැර දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ජීවකාලය මත පිරිවැය කපාහැරීමට හැකිවන පරිදි පහත සඳහන් ආකාරයට ගැළපෙන පරිදි ක්ෂය ප්‍රතිපාදන සලසා තිබේ.

| | |
|---|---|
| කාර්යාල ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යල උපකරණ | 10% |
| පරිගණක උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග සහ වෙබ් නිර්මාණ (අස්පෘශ්‍ය වත්කම්) | 20% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාල බෙදා වෙන්කිරීම් | 20% |
| පාරිභෝගික නොවන භාණ්ඩ | 10% |

3.2.2. ක්ෂය ගණනය කිරීම් සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඍජු ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

3.2.3 පුස්තකාල පොත් සඳහා ක්ෂය කිරීම් සිදුකර නොමැත.

3.2.4 සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය විලම්භිත ආදායම් ගිණුමට බැර කරනු ලැබේ.

3.3 ගොඩනැඟිලි පරිශ්‍ර - කුරුණෑගල

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත පවරා ඇති ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ගෙවිය යුතු රුපියල් මිලියන 01 ක මුදල ගෙවීම වර්ෂ 40 කට වැඩි කාලයක් සඳහා ක්‍රමක්ෂය කර තිබේ.

3.4 ණයගැතියන් සහ ලැබිය යුතු මුදල්

උපලබ්ධි වීම සහ ඇස්තමේන්තු කර ඇති වටිනාකම් මත ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් සටහන් කර තිබේ.

3.5 භාණ්ඩ ලැයිස්තු අවම පිරිවැය මත හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම මත අගය කර තිබේ.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, සහ කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සමාන දෑ වශයෙන් අර්ථ දැක්වේ.

3.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දේ යටතට අතැති මුදල් සහ බැංකු තැම්පතු අන්තර්ගත වේ.

3.7 ස්ථාවර තැන්පතු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි ස්ථිර තැන්පතු ආයෝජන යටතේ වර්ග කරනු ලැබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අත්දැකීම් අනුව ස්ථිර තැන්පතු අදාළ කාලපරිච්ඡේදය තුළදී ආපසු ලබාගෙන නොමැති අතර ස්ථිර තැන්පතු බහුතරයක් අවම වශයෙන් වසර තුනක් පවතින බවට උපකල්පනය කළ හැකිය. මූලික වශයෙන් ස්ථිර තැන්පතු අගය මත ගණනය කරනු ලැබේ.

**4. වගකීම් සහ ප්‍රතිපාදන**

**4.1** ගෙවියයුතු මුදල්

ගෙවිය යුතු මුදල් ඒවායේ පිරිවැය මත සඳහන් කර තිබේ.

**4.2** විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිශ්චිත විශ්‍රාමික දීමනා සැලසුම් ක්‍රම දෙකක් ඇති අතර එම ක්‍රම දෙක සඳහාම දායකත්වය දැරිය යුතුය.

**4.2.1** නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකය

පාරිතෝෂිකය වනාහි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ව්‍යවස්වස්ථාවට අනුකූලව අධිකාරිය පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. මෙම වගකීම සපුරාලීම සඳහා සේවා කාලයේ පළමු වර්ෂයේ සිට

ආරම්භ වී සේවය සපයනු ලබන සෑම වර්ෂයක්ම සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මස සියලුම සේවකයන්ගේ මාසික වැටුප මත ගණනය කරනු ලබන මුදලට සමාන මුදලත් ශේෂ පත්‍රය යටතේ ප්‍රතිපාදනයක් ලෙස ඉදිරියට ගෙන එනු ලබයි. වර්ෂය ආරම්භයේ දී ඉදිරියට ගෙනා ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේ දී පහළට ගෙන ආ ශේෂය අතර වෙනස එය ආදායම් ප්‍රකාශය මඟින් දක්වනු ලැබේ.

පාරිතෝෂික පනත ප්‍රකාර සේවා කාලය අවම වශයෙන් වසරක් සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා පාරිතෝෂික ලබාදීමට ගණනය කරනු ලැබේ. ඒ අනුව 2016.12.31 දිනට වසර 1 සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා සමුච්චිත ප්‍රදාන රු. 45,579,243.75 වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිතෝෂික ප්‍රදාන වෙන් වශයෙන් ආයෝජනය කිරීමට අනුමැතිය ලබාගෙන ඇති හෙයින්, පාරිතෝෂික සඳහා ආයෝජන ගණනය කරන ලද්දේ සේවා කාලය වසර පහට වැඩි සේවකයින්ය. පහත දැක්වෙන්නේ 2016/12/31 දිනට පාරිතෝෂික ආයෝජනයෙහි සාරාංශය සහ ආයෝජනය කළයුතු ශේෂයයි.

| | රුපියල් |
|---|---|
| 2016.12.31 දිනට සේවා කාලය වසර පහට වැඩි සේවකයින් සඳහා | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 39,023,626.00 |
| 2016.01.01. දිනට ආයෝජන | 17,679,313.00 |
| 2016.12.31 දිනට ආයෝජනය කළයුතු ශේෂය | 21,344,313.00 |

මහා භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් අරමුදල් නිකුත් නොකිරීම හේතුවෙන් ආයෝජනය කළයුතු සමුච්චිත ශේෂය තවදුරටත් ඉහළ ගොස් තිබේ.

**4.2.2** නිශ්චිත දායක මුදල් සැලසුම්/ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සියලුම සේවකයින් ස්වකීය සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබයි. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත සේවකයින් ආවරණය කරමින් ගෙවනු ලබන දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා දී තිබේ.

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදල් බලාධිකාරය විසින් සේවකයාගේ දළ වැටුපෙන් 15% සහ 3% බැගින් වූ මුදලක් පිළිවෙළින් දායකකරගනු ලබයි.

**5.** ආදායම

ආදායම හඳුනාගැනීම
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ගලා ඒ යැයි අපේක්ෂා කරන ආදායම් ප්‍රමාණය හඳුනාගෙන ඇත්නම් ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

පොළී ආදායම
නාමික පොළී අනුපාතය භාවිතා කර ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම ගණනය කර සටහන් කරනු ලැබේ. ස්ථිර තැන්පතු සඳහා පොළී අනුපාතය 6% කි. එමනිසා, සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම පසුගිය වසරට වඩා පහළ අගයක් ගනියි.

රාජ්‍ය ප්‍රදාන

රාජ්‍ය ප්‍රදාන  සාධාරණව හිමිවේ යයි සලකා සහ එයට අදාල කොන්දේසි අනුකූලව ඇත්නම් එය රජයේ ආධාර වශයෙන් හඳුනාගැනේ.  ප්‍රදාන  වියදම් අයිතමයක් සේ සම්බන්ධයක් ඇත්නම් (පුනරාවර්තන ප්‍රදාන) එය එම කාලය සඳහා ආදායමක් ලෙස සලකයි. ප්‍රදාන  වත්කම් අයිතමයක් සමඟ  සම්බන්ධයක් ඇත්නම් (ප්‍රාග්ධන ප්‍රධාන) එය විලම්භිත ආදායමක් සේ සළකා අදාළ වත්කමෙහි ජීව කාලය පුරා අදායම සමාන අගයන්ගෙන් නිකුත් කෙරේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුදල් නොවන ප්‍රදාන ලබාගන්නාවිට වත්කම් සහ ප්‍රදාන  දළ වශයෙන් නාමික අගයන් සේ සලකා වත්කමෙහි ජීව කාලය පුරා වත්කම් ප්‍රකාශයට නිකුත් කෙරේ. (IAS 20)

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } වීසීඑම්/ඩී/සීජ්ජ්/1/16 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2017 අගෝස්තු 18 දින. |

සභාපති,

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2017 ජූලි 19 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දඩ මුදල් ආදායම රු.1,667,341 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව වැඩ තහනම් කරන ලද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.324,616 ක් වූ ණය ශේෂය 2017 ජුනි 30 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,271,009 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 14,586,748 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,315,739 ක පිරිහීමක් නිරීක්ෂණය විය. දඩ මුදල් ආදායම රු.3,358,332 කින් හා අනෙකුත් ආදායම්

රු.8,113,301 කින් වැඩිවී තිබුණද, වෙනත් මෙහෙයුම් වියදම් රු.10,747,222 කින් ක්ෂය රු. 3,613,587 කින් හා නඩත්තු වියදම් රු.3,896,863 කින් වැඩිවීම ඉහත පිරිහීමට කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය අතිරික්තයක් පැවති නමුදු එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකීමේදී 2012 වර්ෂයේ දායකය රු.134,568,509 ක් වී තිබුණු අතර එය අඛන්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.260,996,367 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1. කාර්යසාධනය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත අනුව අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

- පාරිභෝගිකයන්ගේ ජීවිත හා දේපල වලට උපද්‍රවයන් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළඳ පිළිවෙත් වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.
- හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරඟකාරී මිලට භාණ්ඩ සහ සේවා වලට ප්‍රමාණවත් ප්‍රවේශයන් ලබා දීමට සහතික වීම සහ
- අසාධාරණ වෙළඳ පිළිවෙත්, සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම් වලට එරෙහිව සහනයක් ලබා දීම.

සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් ඉහත අරමුණු ඉටුකර ගැනීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පානීය ජල බෝතල් සඳහා මිල පාලනය

------------------------------------------

(i) වෙළඳපොලේ අලෙවිවන පානීය ජල බෝතල්වල නිෂ්පාදකයාගේ මිල හා සිල්ලර වෙළෙන්දාගේ මිල සියයට 25 සිට සියයට 55 දක්වා පරාසයක පැවතියද අධිකාරිය විසින් එහි මිල පාලනය කිරීමට පියවරගෙන නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයේදී පානීය ජල බෝතල් සාම්පල 29 ක් රජයේ රස පරීක්ෂක වරයා වෙත යවා ඔහු විසින් කරනු ලැබූ තත්ත්ව පරීක්ෂාවේදී පානීය ජල බෝතල් සාම්පල 25 ක්ම ප්‍රමිතියෙන් තොර බව සනාථ වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එවැනි තත්ත්ව පරීක්ෂාවට ලක් කර තිබුණේ එක් ජල බෝතල් සාම්පලයක් පමණි.

(ආ) ළදරු කිරි පිටි මිල පාලනය

---------------------------

(i) ළදරු කිරිපිටිවල මිල ගණන් පාලනය කිරීම සඳහා 2012 ජුනි 18 දින නිකුත් කළ අංක 1763/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය අවලංගු කර මේ සම්බන්ධ නැවත විමර්ශනය කර නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලෙසට 2013 ජනවාරි 04 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් කළ දැනුම්දීමකට අනුව 2013 ජුලි 10 දින අංක 1818/11 දරන ගැසට් නිවේදනය මගින් ඉහත ගැසට් නිවේදනය පරිච්චින්න කර තිබුණි. එසේ වුවත් මේ සම්බන්ධව නැවත විමර්ශනයකර නව ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ii) ළදරු කිරිපිටි ආනයනය කර අලෙවි කටයුතු පවත්වාගෙන යන සමාගම් අතර ලාභාන්තිකය විවිධ පරාසයන්ගෙන් විචලනය වීම හා ළදරු කිරිපිටි ආනයනය කර අලෙවි කරන සමාගම් 04 ක් විසින් සමාලෝචිත වර්ෂයේ මුල් මාස 6 තුළදී ළදරු කිරිපිටි මෙට්‍රික්ටොන් 867 ක් පමණ අලෙවි කර තිබුණු අතර එය සැලකිය යුතු ප්‍රමාණයක් වීම නිසා ළදරු කිරිපිටි මිල පාලනය සම්බන්ධව අධිකාරියේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) **පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය**

-------------------------------------------

(i) පාරිභෝගිකයන්ට අධිකාරිය වෙත ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට හා ගොවින්ට වෙළඳපලේ තොග හා සිල්ලර මිල ගණන් දැනගැනීම සඳහා 2013 හා 2014 වර්ෂවලදී රු. 9,188,369 ක් වැයකර 1977 ව්‍යාපෘතිය ස්ථාපිත කර තිබුණි. මෙම ව්‍යාපෘතිය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමේදී නිලධාරියෙකු සම්බන්ධ වී පැමිණිලි ලබා ගැනීම 2016 මැයි 17 දිනෙන් පසුව ක්‍රියාත්මක වී නොතිබීම හා වෙළඳපළ මිල ගණන් 2016 අගෝස්තු 12 දිනෙන් පසුව යාවත්කාලීන කර නොතිබීම නිසා මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ii) ගිවිසුම් ප්‍රකාරව අදාල සමාගම විසින් මෙම ව්‍යාපෘතිය යටතේ ලැබෙන ආදායමින් සියයට 20 ක් අධිකාරියට ලබා දිය යුතු වුවද, රු.61,619 ක් ලැබිය යුතුව පැවතුණි.

(ඇ) වැටලීම්

---------

(i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 29 වන වගන්තියට අනුව අධිකාරිය විසින් නිකුත් කරනු ලබන යම් දැන්වීමක් ,විධානයක් හෝ කරනු ලබන යම් අවවාදයක් ප්‍රදර්ශනය කිරීම සඳහා දැන්වීම් පුවරුවක් සෑම වෙළෙන්දෙක් විසින්ම පවත්වා ගත යුතු වුවද වෙළඳසැල් වැටලීම් කරනු ලබන විට ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(ii) 2016 වර්ෂයේදී කරනු ලැබූ වැටලීම්වලින් නඩු පැවරිය හැකි වැටලීම් 709 ක් සඳහා 2017 මැයි 18 දින වන විටත් නඩු පවරා නොතිබුණි.

(ඉ) **වෙළෙන්දන් ලියාපදිංචි කිරීම**

------------------------------------

2003 අංක 9 දරන පාරිභෝගික අධිකාරි පනතේ 27 වන වගන්තියට අනුව දිවයිනේ සෑම වෙළෙන්දකුම අධිකාරියේ ලියාපදිංචි කළ යුතු වුවද අධිකාරිය ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ඊ) දැනුවත් කිරීමේ වැඩසටහන්

(i) මිලදී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය,ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිතිය සහ මිල පිළිබඳව පාරිභෝගිකයින් සහ වෙළෙන්දන් දැනුවත් කිරීම, අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වුවද ඒ සඳහා අඩු අවධානයක් යොමු කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මාසයකට පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 20 ක් නිම කළ යුතු වුවද එක් එක් දිස්ත්‍රික් කාර්යාල සඳහා මාසික ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය පිළිබඳව උපදෙස් ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් සමහර දිස්ත්‍රික්කවල මාසිකව පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ පාරිභෝගික දිනය සැමරීම වෙනුවෙන් සිදු කරන ලද වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම් රු.6,548,487 ක් වූ අතර ඉන් රු.4,147,625 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරා ගන්නා ලද පෞද්ගලික සමාගමක් වෙත දැන්වීම් පළ කිරීම සඳහා ගෙවා තිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩලයේ හෝ භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතියකින් තොරව අධිකාරියේ කටයුතු වෙනුවෙන් 2016 වර්ෂයේදී උපදේශකවරුන් 04 දෙනෙකු පත්කර තිබුණි. එම උපදේශකවරුන් වෙත විධිමත් පරිදි කාර්යයභාර පැවරීමකින් තොරව අමාත්‍යාංශවල බඳවා ගනු ලැබූ උපදේශකවරුන්ට දීමනා ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබුණු 2015 අප්‍රේල් 01 දිනැති අමප/15/0180/613/008 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් 2017 ජනවාරි 31 දින දක්වා උපදේශන දීමනා, ඉන්ධන දීමනා හා ප්‍රවාහන දීමනා වශයෙන් රු.3,303,760 ක් ගෙවා තිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ද්විතියික පදනම යටතේ නිලධාරියකු පත් කර තිබුණු අතර, වසර 06 කට අධික කාලයක සිට ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) වාහන පාලනය | ඌන උපයෝජිත වාහන පැවතීම. |
| (ආ) සේවක ණය | සේවක ණය අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම හා කාල විශ්ලේෂණයක් පිළියෙල නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හා පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා නොතිබීම |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**<u>පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සභාපතිවරයාගේ අදහස් දැක්වීම</u>**

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.2.1** මෙම රු. 1,667,341/- න් නිරූපණය වන්නේ තවදුරටත් ලැබිය යුතු දඩමුදල් වේ. මේවන විට මෙම මුදල් අධිකාරිය වෙත ලැබෙමින් පවතී.

### 2.3 නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මෙම වැඩ තහනම් කරන ලද නිලධාරීන් සම්බන්ධව විනය පරීක්ෂණ කටයුතු මේවන විට ආරම්භ කර ඇත. විනය පරීක්ෂණ කටයුතු අවසන් වූ විගස මෙම මුදල් අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරමි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**(අ) පානීය ජල බෝතල් සඳහා මිල පාලනය**

(i) පානීය ජල බෝතල්වල මිල පාලනය සම්බන්ධ විමර්ශන කටයුතුතවදුරටත් සිදුකරමින් පවතී.

ශ්‍රී ලංකා පානීය ජල බෝතල් නිෂ්පාදකයින්ගේ සංගමය සහ නිෂ්පාදකයින් 75කට අධික සංඛ්‍යාවක් සමඟ අවස්ථා කිහිපයකදීම සාකච්ඡා කරන ලදී. ජල බෝතල් සඳහා උපරිම මිලක් නියම කරනු ලැබුවහොත් ඔවුන්ගේ ව්‍යාපාරය කඩාවැටීමකට ලක්විය හැකි බව බොහෝ දෙනාගේ අදහස විය.

සියළුම නිෂ්පාදකයින් එක්ව සාමූහිකව සිල්ලර වෙළෙන්දාට දෙනු ලබන වට්ටම් පිළිබඳ එක් සාමූහික තීරණයකට එළඹීමට හැකිවුවහොත් වෙළඳපොළ සිල්ලර මිල යම් පමණකට අඩු කිරීමට හැකියාවක් ඇති බව දන්වා සිටි. එම සංගමය, ඒ පිළිබඳව සියළුම සාමාජික නිෂ්පාදකයින්සමඟ සාකච්ඡා කර තීරණය සභාව වෙත දැනුම් දීමට පියවර ගන්නා බවත් ඒ සඳහා යම් කාල සීමාවක් ලබා දෙන ලෙසත් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

එම නිසා ඔවුන්ගේ තීරණය සභාව වෙත දැනුම් දීමෙන් අනතුරුව සභාව විසින් මේ සම්බන්ධව කඩිනමින් වාර්තාවක් නිකුත් කරන බව දැනුම් දෙමි.

(ii) මෙම කරුණ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර එහිදී අනාවරණය වූ පරිදි,පානීය ජල බෝතල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව පරීක්ෂා කිරීමේදී මතු වූ ගැටළු ප්‍රධාන වශයෙන්, PH අගය අඩුවීම සහ අදාළ ජල සාම්පල්වල ග්‍රීස් හා ඔයිල් අන්තර්ගතවීම නිසා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර උපදේශන කමිටුවේ අවධානයට ලක්කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඔයිල් සහ ග්‍රීස්වල සීමාවන් බැහැර කරමින් චක්‍රලේඛයක් නිකුත් කරමින් එහි, සඳහන් කර ඇත්තේ ඔයිල් සහ ග්‍රීස් එන්නේ ජල ප්‍රභවයෙන් නොව ඇසුරුම් නිෂ්පාදනයේදී යොදාගන්නා ලිහිසි තෙල් වලින් බවයි. පානීය ජල බොතල්වල ජලය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතිය දැනට අනිවාර්ය ප්‍රමිතියක් නොවේ. ඒ කරුණුත් සැලකිල්ලට ගෙන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පානීය ජලය ඇසුරුම් සඳහා යොදාගන්නා PET (පොලිමර් / පොලිතීන් ටෙරෙප්තලේට්) බෝතල් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය අනිවාර්ය කරනු ලැබීණි. මෙසේ තිබියදී PET බොතල් නිෂ්පාදකයින් විසින් SLS සංශෝධන කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ඉල්ලීමක් කර ඇති අතර මේ වන විට එම ප්‍රමිති සමාලෝචන කමිටු එක්වී අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට කටයුතු කරයි. කෙසේ වෙතත් ඉදිරියේදී ද පානීය ජල බෝ තල් ඇසුරුම මෙන්ම පානීය ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරිමට කටයුතු කරනු ඇත.

(ආ) **ළදරු කිරි පිටි මිල පාලනය**

i. ළදරු කිරිපිටි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතෙහි 18(1) වගන්තිය මගින් නිශ්චිත භාණ්ඩයක් ලෙස නම් කර ඇති බැවින් හා 18(2) (3) වගන්තිය යටතේ අධිකාරියෙහි පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව මිළ ඉහළ දැමීමක් සිදු කළ නොහැකි බැවින් ඒ හරහා එහි මිළ පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

ii. 2012 වර්ෂයේ නෙස්ලේ සමාගම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට විරුද්ධව අදාළ සමාගම ආනයනය කර බෙදාහරිනු ලබන ළදරු කිරිපිටි මිළ අඩුකිරීම සඳහා අධිකාරිය විසින් නිකුත් කරන ලද ගැසට් පත්‍රයට විරුද්ධව පැවරූ නඩුවේදී, විගණන විමසුමෙහි ඔබ දක්වා ඇති පරිදි අදාළ ගැසට් පත්‍රය අවලංගු කරමින් මෙම කාරණය නැවත විමර්ශනය කරන ලෙසට නියෝග කරමින් 2013 ජනවාරි 04 වන දින නඩු තීන්දුවක් ප්‍රකාශයට පත්කර නොමැත.

iii. ඉදිරියේදී මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි.

(ඇ) **පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය**

(i) අධිකාරිය විසින් පාරිභෝගික සේවා විමසුම් ව්‍යාපෘතිය ඇගයීමට ලක්කර සේවාවේ වැඩිදියුණු කිරීමේ කටයුතු කිරීම සඳහා අනු කමිටුවක් පත්කර අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගන්නා ලද අතර මේ වනවිට 1977 ව්‍යාපෘතිය ක්‍රියාකාරී තත්ත්වයේ පවතී.

(ii) 2015 වර්ෂයට ලැබිය යුතු අදායම වූ රු.61,619/- මුදල 2017 මාර්තු 23 දින ලැබී ඇත.

(ඈ) **වැටලීම්**

(i) පනතෙහි 29 වන වගන්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස නිළධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරමි.

(ii) 2016 වසර තුළ සිදු කරන ලද වැටලීම් බොහොමයකට මේ වන විට නඩු පවරා අවසන් අතර, 2016.05.18 වන දින වන විට නඩු පැවරීම් සිදුකළ යුතුව ඇති වැටලීම් ප්‍රමාණය 709කි.මේ සඳහා ද ඉදිරිමාස 2ක පමණ කාලයක් තුළ නඩු පැවරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

(ඉ) **දැනුවත් කිරිමේ වැඩසටහන්**

(i) පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරිය විසින් පාරිභෝගිකයින් දැනුවත් කිරිම සඳහා විවිධ ක්‍රමවේදයන් යොදාගන්නා අතර, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් කරන දැනුවත් කිරීම්, මහජන ප්‍රදර්ශන, දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් මේ අතරින් ප්‍රධාන වේ. පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන් මඟින් වැටලීම් සිදුකිරිම, අදාළ වැටලීම් සඳහා නඩු පැවරීම් හා උසාවි රාජකාරි, පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන්, පාරිභෝගික පැමිණිලි, වෙළෙඳපොළ සමීක්ෂණ යන රාජකාරීන් සියල්ල සිදු කරනු ලබයි. පාරිභෝගික සුරක්ෂිතතාව ඇති කිරිම සඳහා ඉහත කාර්යයන් සියල්ල සිදුකිරිම අවශ්‍ය වේ. දිස්ත්‍රික්කය සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව හා අනෙකුත් භෞතික සම්පත් සීමාව තුළ මෙම වැඩසටහන් සිදුකිරීමට නිලධාරීන්ට සිදුවේ.

කෙසේ වෙතත්, පාරිභෝගික ආරක්ෂණය සඳහා පාරිභෝගික දැනුවත් කිරීම් වැදගත් වන බව අධිකාරිය පිළිගන්නා අතර, ඒ සඳහා ඉදිරියේදී වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කරනු ඇත.

(ii)/ (iii) දැනුවත් කිරිමේ වැඩසටහන් ඉලක්ක පිළිබඳව දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම්වලත් නිලධාරීන් දැනුවත් කරනු ලැබේ. තවදුරටත් එම ඉලක්ක දිස්ත්‍රික් කාර්යාල සඳහා ලිඛිතව ලබාදීමට පියවර ගනු ඇත.

(ii) / (iii) දැනුවත් කිරීමේ වැඩසටහන් ඉලක්ක පිළිබඳව දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම්වලත් නිලධාරීන් දැනුවත් කරනු ලැබේ. තවදුරටත් එම ඉලක්ක දිස්ත්‍රික් කාර්යාල සඳහා ලිඛිතව ලබාදීමට පියවර ගනු ඇත.

දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය වැඩි කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරමි.

වරින් වර මතුවන ප්‍රායෝගික ගැටළු පිළිබඳව මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීමට පාරිභෝගික අධිකාරිය නිරන්තරයෙන් කටයුතු කරයි. මේ සඳහා එක් උදාහරණයක් ලෙස, ප්ලාස්ටික් සහල් පිළිබඳව ජනතාව අතර ප්‍රවෘත්තියක් පැතිරී ගිය අවස්ථාවේදී , ඒ පිළිබඳව විද්‍යාගාර පරීක්ෂණ පවත්වා අදාළ වාර්තා ලබාගැනීමට පාරිභෝගික අධිකාරිය කටයුතු කළ අතර, විද්‍යුත් හා මාධ්‍ය මඟින් මහජනතාව දැනුවත් කිරීමට ක්‍රියාකරන ලදී. ඉදිරියේ දී වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී මාධ්‍ය දැනුවත් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීමට කටයුතු කරනු ඇත.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අධිකාරියට එරෙහිව අධිකරණවල ගොනු කරනු ලබන නඩු සඳහා සෑම අවස්ථාවකම අපගේ ඉල්ලීම පරිදි නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන් පෙනී සිටිනු ලබන අතර, අප අර්ධ රාජ්‍ය ආයතනයක් බැවින්,ඒ සඳහා ගාස්තුද අයකරනු ලැබේ. අදාළ නඩු කටයුතු කුමන අවස්ථාවක අවසන් වුවද, ඒ දක්වා අධිකරණයේ පෙනී සිටීම, සාකච්ඡා (Consultations)පැවැත්වීම, උත්තරවාද සකස් කිරීම ආදී විවිධ කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවිය යුතු වේ. ඒ අනුව පමණි, අදාළ නඩු කටයුතු වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගාස්තු ගෙවීමක් සිදුවනුයේ.

යම් හෙයකින් නඩු කටයුත්තක් නඩු තීන්දුවකින් අවසාන වීමට පෙර දෙපාර්ශවය අතර සමථයකින් අවසාන වුවහොත් හෝ පැමිණිලි/ පෙත්සම්කරු විසින් වෙන යම් හේතුවක් නිසා අතරමගදී නඩු කටයුත්තක් ඉල්ලා අස්කරගතහොත් , ඒ සඳහා යම් අවස්ථාවලදී (nominal) නාමික නඩු ගාස්තුවක් නඩුව ඉල්ලා අස්කරගනු ලබන පාර්ශවය විසින් ගෙවිය යුතු බවට අධිකරණය නියම කරනු ලබන අතර , බොහෝ අවස්ථාවල නඩු කටයුත්තක් ඉල්ලා අස්කර ගැනීමේදී එය ගාස්තුවට යටත් නොවන බවට අධිකරණය තීරණය කරනු ලැබේ. තවද නඩු තීන්දුවක් ප්‍රකාශ කිරීමේදී ද නඩු ගාස්තු නියම කිරීමක් අධිකරණය විසින් කරනු ලැබේ. ඒ හැර නඩු කටයුත්තක් අවසාන වීමට පෙර පැමිණිලි / පෙත්සම්කරු එය ඉල්ලා අස්කරගතහොත් එම නඩු සඳහා ඒ වෙනුවෙන් වැයකරන ලද මුදල් නීතිපති දෙපාර්තමේන්තුව හරහා අප අධිකාරියට අදාළ පැමිණිලි / පෙත්සම්කරුගෙන් අයකර ගැනීමට හැකියාවක් නොමැති අතර , කුමන අයුරකින් නඩු කටයුත්තක් අවසන් වුවද, නඩු ගාස්තු නියම කළ හැක්කේ අධිකරණයකට පමණක් බව පෙන්වා දෙමි.

(ආ) 2016 වර්ෂයේ "ජගත් පාරිභෝගික අයිතිවාසිකම් දිනය" මහනුවර නගරයේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලදී.

කෙසේ නමුත් , 2016 මාර්තු මස 15 වන දිනට ආසන්න දිනක සිදුවූ අස්ගිරි මහානායක ස්වාමීන් වහන්සේගේ අපවත්වීම වෙනුවෙන් රජය විසින් ශෝක කාලයක් ප්‍රකාශයට පත් කරන ලද අතර, එබැවින් සැළසුම් කරන ලද පරිදි ජාතික උත්සවය මහනුවර දී පැවැත්වීමට නොහැකි විය.

ඒ අනුව 2016 පාරිභෝගික දිනය පැවැත්වීම පිළිබඳ නිශ්චිත තීරණයක් නොවූ අතර අවසානයේ එය මුලතිව් දිස්ත්‍රික්කය තුල පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් සැලැසුම් කල ආකාරයට නොව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා කිරීමට තීරණය කරන ලදී. මෙම දැන්වීම් පළ කිරීම සීමිත කාලයක් තුළ සිදුකළයුතු වු බැවින්, ඒ සඳහා හෝම්ස් පොලාඩ් ආයතනයෙහි සේවය ලබාගැනීමට අධිකාරිය කටයුතු කළ අතර, ගෙවීම් සිදුකිරීමේදී දැන්වීම් පළ

කරන ලද අදාළ මාධ්‍ය ආයතන වෙතින් ද අධිකාරිය මිල ගණන්(rate card) ලබාගෙන හෝම්ස් පොලාඩ් මිලගණන් සමඟ සන්සන්දනය කිරීමක් සිදුකරන ලදී. ඒ අනුව එහි වාසිදායක තත්වයක් තිබූ බැවින් හෝම්ස් පොලාඩ් ආයතනයසඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය (2017.02.27, CAA/HRA/29/2017/AOB-02-04) ලබාගැනීමෙන් අනතුරුව අදාළ ආයතනය වෙත ගෙවීම් සිදු කරන ලදී. කෙසේ නමුත් ඉදිරියේදී මෙවැනි කාර්යයන් සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට සටහන් කරගන්නා ලදී.

මෙහි තිබූ වාසිදායක තත්වය පහත සඳහන් සංඛ්‍යා පරීක්ෂාකිරීමෙන් වැඩිදුරටත් තහවුරු වේ.

| මාධ්‍ය ආයතනය | හෝම්ස් පොලාඩ් ආයතනයට ගෙවීම් කරන ලද මිළ | වෙළඳපළ මිල (As per rate card) |
|---|---|---|
| හිරු | 500,000 | 995,000.00 |
| සූරියන් එෆ්එම් | 500,000 | 1,002,000.00 |
| ගෝල්ඩ් එෆ්එම් | 500,000 | 996,350.00 |

තවදුරටත් පුවත්පත් දැන්වීම් සඳහා වන අදාළ මිළ ගණන්වලටම දැන්වීම් සංකල්ප සකස්කිරීම, පිටපත් සකස් කිරීම, භාෂා 3න් පිටපත් සකස් කිරීම සහ නිර්මාණ සකස් කිරීම යන කාර්යයන් කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව සිදු කරදීම අධිකාරියට වාසිදායක විය.

(ඇ) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පනතේ 53 වන වගන්තිය ප්‍රකාරව උපදේශකයන් පත්කිරීමේ කටයුතු සිදුව ඇත. මේ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිළධාරී වශයෙන් අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදෙන ලද උපදෙස් අනුව කටයුතු කිරීමට අධිකාරිය විසින් තීරණයක් ගන්නා ලදී.

(ඇ) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පනත අනුව අධිකාරියේ නිශ්චිත කාර්ය මණ්ඩලයෙන් ඉටුකර ගත නොහැකි කාර්යයන් කිරීමට උපදේශකවරු පත්කර ඇත.

**4 .3 කාර්ය මණ්ඩල පරිපාලනය**

අධිකාරියේ පුරප්පාඩු පවතින තනතුරු සඳහා අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාමට එම තනතුරුවල අවශ්‍යතාවයේ ප්‍රමුඛත්වය මත එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත.

ඒ අනුව විමසුමෙහි සඳහන් කර ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසු අය බඳවාගෙන එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. එනම් විගණන විමසුමෙහි සඳහන් දිනය වන 2017.03.23 දින වන විටත් පහතින් සඳහන් තනතුරු සඳහා පුරප්පාඩු පුරවා තිබූ බව සඳහන් කරමි.

| <u>තනතුර</u> | <u>පුරප්පාඩු සංඛ්‍යාව</u> | <u>පත්වීම් දිනය</u> |
|---|---|---|
| විගණන නිළධාරී | 02 | 2017.01.16 |
| පද්ධති පරිපාලක | 01 | 2017.01.02 |
| විමර්ශන නිළධාරී | 62 | 2017.02.01 |

අධිකාරියේ සේවක මණ්ඩලයේ පුරප්පාඩුව පවතින සේවක මණ්ඩල තනතුරු සඳහා සුදුසු නිළධාරීන් බඳවා ගැනීමට 2017.01.09 දින පල කරන ලද පුවත්පත් දැන්වීම් අනුව බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ කැඳවා අවසන් කර ඇත. තවද, තෝරාගත් අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත. අදාළ අනුමැතීන් ලැබුණු පසු අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව එම තනතුරු සඳහා පත්කිරීම් සිදුකිරීමට නියමිතව ඇත.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| කළමනාකරණ සහකාර | 20 |
| රියදුරු | 10 |
| පරිපාලන නිලධාරි | 02 |

දැනට පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුරු සඳහා සුදුසු අය බඳවාගෙන අදාළ පුරප්පාඩු පිරවීම සඳහා දැනට කටයුතු කරමින් සිටී. ඒ අනුව 2017.04.08 දින ප්‍රසිද්ධ පුවත්පත් මඟින් දැන්වීම් පළකර එම තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතීන් ලබාගෙන අදාළ තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් සිටී.

**5. පද්ධති හා පාලනයන්**

අ සිට ඈ දක්වා කරුණු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පවත්වාගෙන යාම අධිකාරියේ අවධානයට යොමුව ඇති අතර මේ සඳහා අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

හසිත තිලකරත්න
**සභාපති**